**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය**
**(අංක 757/10 - 1993 මාර්තු 11 වැනි බ්‍රහස්පතින්දා)**

# ශ්‍රී ලංකා නාවික හමුදා වැටුප් සංග්‍රහය 1982

LWTR HAWK Premarathna - SW 31744

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

**අති විශෙෂ** **அதிவிசேஷமானது** **EXTRAORDINARY**

අංක 1,010/1 - 1998 ජනවාරි 13 වැනි අඟහරුවාද - 1998.01.13

**1,010/1 ஆம் இலக்கம் — 1998 ஆம் ஆண்டு சனவரி மாதம் 13 ஆம் திகதி செவ்வாய்க்கிழமை**

**No. 1,010/1 - TUESDAY, JANUARY 13, 1998**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)** **(அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)** **(Published by Authority)**


# I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. - බී. 26/50.

අංකය : ඩී/24/ඇල්.ජී.ඇල්/එත්වයි.

### නාවික හමුද පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු (358 වන අධිකාරය වූ) නාවික හමුද පනතේ 161 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝගය.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපති.

1997 අගෝස්තු මස 25 වන දින,
කොළඹ දී ය.

### නියෝගය

1993 මාර්තු මස 11 වන දින අංක 757/10 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1982 නාවික හමුද වැටුප් සංග්‍රහය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 2 වන නියෝගයේ -

(i) (3) වන ඡේදයේ (ii) (ආ) අනුඡේදයේ වෙනුවට පහත දක්වෙන අළුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(ii) අල්ලස් ගැනීමක් කර ඇතැයි හෝ අත්‍යාකාරයක නීතිවිරෝධී ඵල ප්‍රයෝජනයක් ලබා ඇතැයි ; හෝ" ;

(ii) එහි (ii) වන. අළුත් අනුඡේදයට ඉක්බිතිවම පහත දක්වෙන අළුත් අනුඡේදය එකතු කිරීමෙන් :-

"(iii) සොරකම් කිරීම, කොල්ලකෑම, ගෙවල් බිඳීම, සිවිල් පුද්ගලයන් මත සාපරාධී බලය යෙදීම, ස්ත්‍රී දූෂණය සහ මිනීමැරීම කර ඇතැයි හෝ එවැනි වරදක් කිරීමට තැත් කිරීමක් හෝ, සිදුකර ඇති අවස්ථාවක." ;

(2) එහි 22 වන නියෝගයේ -

(4) වන ඡේදයේ (ආ) අනුඡේදය වෙනුවට පහත දක්වෙන අළුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :-

(ආ) යම් නැවියකු

(i) රජයට පාඩුවක් වන අන්දමට, රජයට හෝ නාවික හමුදවට හෝ අයත් දේපලක් වංචාවෙන් අත්කර ගැනීම හෝ වංචාවක් හෝ හොර අත්සන් තැබීමක් හෝ ඒ හා සමාන වෙනත් වරදක් කර හෝ ඇති බවට; හෝ

(ii) අල්ලස් ගැනීමක් හෝ අත්‍යාකාරයක නීති විරෝධී ඵල ප්‍රයෝජනයක් ලබා ඇති බවට ; හෝ

(iii) සොරකම් කිරීම, කොල්ලකෑම, ගෙවල් බිඳීම, සිවිල් පුද්ගලයන් මත සාපරාධී බලය යෙදීම, ස්ත්‍රී දූෂණය සහ මිනීමැරීම කර ඇත්තා වූ හෝ එවැනි වරදක් කිරීමට තැත් කිරීමක් හෝ සිදු කිරීමක් කර ඇත්තා වූ බවට ; හෝ

මුල් බැල්මට පෙනෙන පරිදි ඔප්පු කරනු ලැබ, නාවික කාර්යවල යෙදීම අත්හිටවනු ලැබූවිට එසේ අත්හිටවනු ලැබූ දිනයේ සිට ඔහුට කවර හෝ පාරිශ්‍රමිකයක් නොලැබිය යුතු ය. එවැනි සෑම අවස්ථාවක දී ම ගෙවීම අත්හිටුවීමේ නියමය ලේකම්වරයා විසින් කරනු ලැබිය යුතු ය.".

(3) මෙම නියෝගයේ (1) වන සහ (2) වන ඡේදවලින් නාවික හමුද වැටුප් සංග්‍රහයට කෙරෙන සංශෝධනයන් 1993 මාර්තු මස 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බලාත්මක වනු ඇත.

12 - 08


සැ.යු. - අති විශෙෂ ගැසට් අංක 1,009/1 කාණ්ඩය අංක 1,009/19න් අවසන් වේ.
கு. க. — 1,009/1 ஆம் இலக்கம் கொண்ட அதிவிசேஷ வர்த்தமானித் தொடரின் இறுதி இல. 1,009/19.
N.B.- *Gazette Extraordinary* Series No. 1,009/1 ends with 1,009/19.
I A - D 047156 - 1,310 (97/11)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 757/10—1993 මාර්තු 11 වැනි බ්‍රහස්පතින්දා—1993.03.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ලේ.බී—වී. 126/59 (ii). ඩී. 21/එල්ජීඑල්/එන්වයි,.

### නාවික හමුදා පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු (358 වන අධිකාරිය වූ) නාවික හමුදා පනතේ 161 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

ආර්. ප්‍රේමදාස,
ජනාධිපති.

1992 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 1982 ශ්‍රී ලංකා නාවික හමුදා වැටුප් සංග්‍රහය යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1982 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය:—

### I වන කොටස—නිලධරයන්, මධ්‍ය නිලධරයන් සහ ශිෂ්‍ය භට නිලධරයන්

#### නිලධරයන්ගේ වැටුප්

2. (1) තම ස්ථිර නිලය සම්බන්ධයෙන් (වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධරයන් සහ විනිශ්චයකාර අධිනීතිඥ ජනරාල් නොවන) නිලධරයකු හට අදාළ වන්නා වූ ඒකාබද්ධ වැටුප් පරිමාණය පහත දැක්වෙන පරිදි විය යුතුය :—

| නිලය | වැටුප් පරිමාණය |
|---|---|
| වැඩ බලන උප ලුතිනන්–ශිෂ්‍යභට නිලධරයකුවශයෙන් පිවිසි .... | වර්ෂයකට රු. 13,800 |
| වැඩ බලන උප ලුතිනන්–ශිෂ්‍ය භට නිලධරයකු වශයෙන් නොපිවිසි ... | වර්ෂයකට රු. 18,000 |
| උප ලුතිනන් ... ... | වර්ෂයකට රු. 18,600 කින් ආරම්භ වී, රු. 600 /බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක 3කින් රු. 20,400 දක්වා වැඩිවේ. |
| ලුතිනන් (වැඩ බලන ලුතිනන් ඇතුළුව) ... | වර්ෂයකට රු. 22,200 කින් ආරම්භ වී, රු. 600 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක අටකින් රු. 27,000 දක්වා වැඩිවේ. |
| ලුතිනන් කමාන්ඩර් ... ... | වර්ෂයක්ට රු. 26,400 කින් ආරම්භ වී, රු. 600 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක අටකින් රු. 31,200 දක්වා වැඩිවේ. |
| කමාන්ඩර් ... ... ... | වර්ෂයකට රු. 30,600 කින් ආරම්භ වී, රු. 600 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක හයකින් රු. 34,200 දක්වා වැඩිවේ. |
| කපිතාන් ... ... ... | වර්ෂයකට රු. 35,700 කින් ආරම්භ වී, රු. 900 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක තුනකින් රු. 38,400 දක්වා වැඩිවේ. |
| කොමඩෝරු ... ... | වර්ෂයකට රු. 39,600කින් ආරම්භ වී, රු. 1,200 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක තුනකින් රු. 43,200 දක්වා වැඩිවේ. |
| රියර් අද්මිරාල් ... ... | වර්ෂයකට රු. 46,800 කින් ආරම්භ වී, රු. 1,200 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක තුනකින් රු.50,400 දක්වා වැඩිවේ. |



A1—D 023453— 1,410(92/07)

GP 2208



(2) කිසිම නව ප්‍රවේශක නිළධරයකු—

(අ) ආයතන සංග්‍රහයෙහි නියමිත සුදුසුකම්, තමා සතුව ඇත්නම් ; හෝ

(ආ) නියමිත ප්‍රවීණතා විභාග

ආයතන සංග්‍රහයෙහි සඳහන් පරිදි රාජ්‍ය භාෂාවෙන් සමත්ව ඇත්නම් මිස,

තම නිලයට උචිත වැටුප් වර්ධක නොලැබිය යුතු ය.

(3) (අ) මෙහි (ආ) අනු ඡේදයෙහි සඳහන් හේතුන් මත හැර වෙනත් හේතුන් මත සිය පදවියෙහි කාර්ය සහ කටයුතු කිරීමෙන් යම් නිළධරයකු අත්හිටුවනු ලැබ සිටින අවස්ථාවක ඒ නිළධරයාට ගෙවිය යුතු ඒකාබද්ධ වැටුපෙන් අඩක්, එසේ අත් හිටුවනු ලැබ සිටින කාලපරිච්ඡේදයේ එක් එක් මාසය වෙනුවෙන් ගෙවනු ලැබිය යුතු ය ;

එසේ වුවද, එවැනි නිළධරයකුගේ වේතනවලින් ඉහත සඳහන් දෙකෙන් එක් පංගුවකට වැඩි අනුපාතයක් ගෙවීම සඳහා සිය අභිමතය පරිදි, ලේකම්වරයා විසින් බලය දෙනු ලැබිය හැකි ය.

(ආ) තමා විසින්—

(i) රජයට පාඩුවක් වන අන්දමට රජයට හෝ නාවික හමුදාවට හෝ අයත් දේපළක් සම්බන්ධයෙන්, වංචාවක් හෝ වංචාවක් හෝ ව්‍යාජ අත්සන් තැබීමක් හෝ වෙන යම් සමාන වරදක් හෝ සිදුකර ඇතැයි හෝ,

(ii) අල්ලස් ගැනීමක් කර ඇතැයි හෝ වෙනත් ආකාරයක නීති විරෝධී ඵල ප්‍රයෝජනයක් ලබා ඇතැයි හෝ ;

මුල්බැලීමට ඔප්පු කරනු ලැබ ඇති යම් නිළධරයකු, තම ධුරයේ කාර්ය සහ කටයුතු කිරීමෙන් අත් හිටවනු ලැබ ඇති අවස්ථාවක, ඒ අත්හිටුවීමේ දින සිට ඒ නිළධරයා කවර වූ හෝ වේතනයක් නොලැබිය යුතු ය. එවැනි සෑම අවස්ථාවකදීම, ඒ ගෙවීම නවතාලීමේ නියමය ලේකම්වරයා විසින් කරනු ලැබිය යුතුය.

(ඇ) (ආ) අනුඡේදයෙහි සඳහන් කවර වූ හෝ හේතුවක් මත තම ධුරයේ කාර්ය හා කටයුතු කිරීමෙන් යම් නිළධරයකු අත්හිටවනු ලැබ ඇත්තා වූ ද ඒ ඒ නිළධරයාට විරුද්ධව ඇති විනයානුකුල කටයුතු එක් වසරක කාල සීමාවක් තුළදී අවසන් නොකරනු ලබන්නා වූ අවස්ථාගත කරුණු අනුව, ලේකම්වරයාගේ මතය අනුව, ඒ නිළධරයාගේ වේතනය තවදුරටත් අත්හිටුවීම සාධාරණවීමට තරම් බරපතල නොවන්නා වූ ද අවස්ථාවක, ඒ නිළධරයාගේ මුළු මාසික වේතනවලින් අඩකට නොවැඩි මුදලක්, එසේ එක් වසරක කාල පරිච්ඡේදය අවසාන වීමෙන් පසුව සහ අත්හිටුවනු ලැබ සිටින නිළධාරයා හේතුකොට ගෙන හෝ ඔහුගේ ඉල්ලීම පිට හෝ විනයානුකූල ක්‍රියාවක් කල්දැමීම නිසා, ඇතිවූ පමාවීම් සැලකිල්ලට ගෙන ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලබන අතිරේක කාලපරිච්ඡේදයක් ද අවසාන වීමෙන් පසුව, ඒ නිළධරයාට ගෙවීම සඳහා ආයතන අධ්‍යක්ෂගේ ද එකඟත්වය ඇතිව, බලය දීම, ලේකම්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(ඈ) යම් නිළධරයකුගේ ධුරයේ කාර්ය හා කටයුතුවල යෙදීමෙන් ඔහු අත්හිටුවා ඇති අවස්ථාවක, මේ වැටුප් සංග්‍රහයෙහි ඇතුළත් වෙනත් යම් විධිවිධාන යටතේ ලැබීමට හිමිකම ඇතිවිය හැකිව තිබූ යම් වැටුප් වර්ධකයක් ඒ නිළධරයාට නොලැබිය යුතු ය ;

එසේ වුව ද, ඒ නිළධරයා පසුව නැවත සේවයෙහි පිහිටුවනු ලැබූ විට, සිය ධුරයේ කාර්ය සහ කටයුතු කිරීමෙන් ඔහු අත් හිටුවනු නොලැබුවේ නම්, මෙම වැටුප් සංග්‍රහයේ විධිවිධාන යටතේ ලැබීමට හිමිකම් තිබිය හැකි සියලු වැටුප් වර්ධක ඒ නිළධරයාට ගෙවනු ලැබිය හැකි ය.

(ඉ) සිය ධුරයේ කාර්ය හා කටයුතු කිරීමෙන් අත් හිටුවනු ලැබූ යම් නිළධරයකු නැවත සේවයෙහි පිහිටුවනු ලැබූ විට, අත් හිටවුනු ලැබ සිටි කාලය තුළ ඔහුගේ වේතනවලින් නොගෙවන ලද ප්‍රමාණය ඔහුට ගෙවනු ලැබිය හැකි ය.

(ඊ) සිය ධුරයෙහි කාර්ය හා කටයුතු කිරීමෙන් අත්හිටුවනු ලැබ ඇති කවර වූ හෝ නිළධරයකු නාවික හෝ සිවිල් හෝ වරදක් වන ක්‍රියා හෝ ක්‍රියාවක් කර තිබේ යයි (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක් මගින් හෝ නාවික හෝ සිවිල් හෝ අධිකරණයක් මගින් හෝ නිගමනය කරනු ලැබුවහොත්, එවැනි කවර වූ හෝ නිළධරයකු හට, රාජකාරී කටයුතුවල යෙදීම අත්හිටුවනු ලැබ සිටි කාලය තුළ ඔහුට නොගෙවන ලද වේතන ප්‍රමාණය හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු නොලැබිය යුතු ය;

එසේ වුවද, එවැනි නිළධරයකු කර ඇති ක්‍රියාව හෝ ක්‍රියා, ඔහු සේවයෙන් පහ කරනු ලැබීමට අවශ්‍ය නොවන අන්දමේ සුළු පැහැර හැරීමක් හෝ විෂමාචාරයක් හෝ යයි එවැනි අධිකරණයක් හෝ පරීක්ෂණ කොමිෂන් සභාවක් හෝ මගින් නිගමනය කරනු ලැබ ඇති අවස්ථාවක, සහ අවස්ථාගත කරුණු අනුව සළකන විට, ඉහත (අ) අනු ඡේදය යටතේ ඒ නිළධරයාගේ වේතනවලින් අඩුකර ගැනීම තදබල දඬුවමක් යයි ලේකම්වරයා විසින් සළකනු ලබන අවස්ථාවක, අත්හිටුවනු ලැබ සිටි කාලය තුළ නොගෙවන ලද සම්පූර්ණ වේතන හෝ එම කාලය තුළ ඔහුගේ වේතනයෙන් ගෙවනු ලැබූ අනුපාතිකයට වඩා වැඩි අනුපාතිකයක් හෝ ඒ නිළධරයාට ගෙවන ලෙස ලේකම්වරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(උ) මේ නියෝගයේ කාර්යය සඳහා, " සිය ධුරයේ කාර්යය හා කටයුතු වලින් අත්හිටුවනු ලැබූ නිළධරයා " යන්නට වෙනත් යම් ධුරයකට පත් නොකොට තම ධුරය අත් හැරීමට නියම කරනු ලැබූ නිළධරයකු සහ තම ධුරයෙන් නිදහස් කරනු ලැබූ නිළධරයකු ඇතුළත් වේ.

## වැඩ බැලීමේ වැටුප

3. (1) තනතුරක් ස්ථිර වශයෙන් දරන්නකු නොමැති වන හෝ එම තනතුර ස්ථිර වශයෙන් දරන්නා නොපැමිණ සිටින කාලය තුළ හෝ දැනට සිටින නිලයට වඩා ඉහළ නිලයක වැඩ බැලීම සඳහා නාවික හමුදාපති විසින් පත් කරනු ලැබ ඇති යම් නිළධරයකු හට ඒ නිළධරයා ඒ තනතුරෙහි අවම වශයෙන් දෙමසක අඛණ්ඩ කාලයක් වැඩ බැලීම කර ඇත්නම් වැඩ බැලීමේ වැටුප ගෙවනු ලැබිය යුතු ය.

(2) වැඩ බැලීමේ පත්වීම් දරන රාජ්‍ය නිළධරයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන යටතේ ගණනය කරනු ලබන්නා වූ වැටුප එම ආකාරයෙන්ම ඉහත (1) වන ඡේදයෙහි විධිවිධානවලට අනුකූලව වැඩ බැලීමට පත් කරනු ලබන නිළධරයා ලැබිය යුතු ය.

4. නිළධරයකුගේ වැටුප් වැඩිවීමේ කාර්ය සඳහා ගණන් ගත හැකි සේවය—

(අ) තාවකාලික වශයෙන් හෝ ස්ථිර නිලයක, රාජකීය ලංකා නාවික හමුදාවේ සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ පූර්ණ වැටුප් සහිතව ඉටුකරන ලද මුළු අධිකාරිලත් සේවා කාලය ;

(ආ) යම් නිළධරයකු රාජකීය ලංකා නාවික හමුදාවෙහි හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවෙහි හෝ පත්වීමක් ලැබුවේ නැතහොත් උසස්වීමක් ලැබුවේ යම් නිලයකට ද, ඒ නිලයෙහිම ඊට කලින් බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩල සන්නද්ධ හමුදාවල, ලංකා ආරක්ෂක බල හමුදාවල පූර්ණ වැටුප් සහිත අධිකාරී ලත් අන්තර්ගත හෝ සක්‍රිය හෝ මුළු සේවා කාලය ;

(ඇ) දරන නිලයට වඩා ඉහළ නිලයක තාවකාලික හෝ වැඩ බැලීමේ නිලයක් උසුලමින් සිටියදී ද්විතීයනය කරනු ලැබුවා වූ ද, එහෙත් එවැනි තාවකාලික නිලයට හෝ වැඩ බැලීමේ නිළයට හෝ පෙර දරූ ස්ථිර නිලයෙහි සේවා කාලය සම්බන්ධයෙන් පමණක් ගණන් ගත හැක්කා වූ ද යම් නිළධරයකුගේ සේවය; සහ

(ඈ) ශ්‍රී ලංකා රජයේ අනුමතය ඇතිව ස්ථාපිත මණ්ඩලවල සහ සංස්ථාවල සේවය සඳහා රාජ්‍ය සේවකයකු වශයෙන් ද්විතීයනය කරනු ලැබ ඇති නිළධරයකු වශයෙන් වූ සේවා කාලය,

විය යුතු ය.

## නිලධරයන්ගේ දීමනා

**ආහාර සැපයීම**

5. (1) නේවාසිකාගාරයක වාසය කරන අවිවාහක නිලධරයකුට සහ ඇතුළත වාසය සඳහා නියෝග ලැබ ඇති හෝ අවසර ලබා ඇති විවාහක නිලධරයකුට ආහාර නාවික හමුදා විධිවිධාන යටතේ සැපයිය යුතු අතර, නාවික හමුදාධිපති විසින් වරින් වර නිශ්චය කරනු ලබන පරිදි සේවා ස්ථාන සළාකයේ වටිනාකම නිලධාරි නිවාසයට ගෙවනු ලැබිය යුතු ය.

(2) එවැනි නිලධරයකුට සැපයිය යුතු ආහාර සළාකයේ ප්‍රමාණය ලේකම්වරයාගේ අනුමතය ඇතිව නාවික හමුදාධිපති විසින් වරින්වර නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) පිටත වාසය කිරීමට අවසරය ලබා ඇති නිලධරයන්ට වරින්වර නාවික හමුදාධිපති විසින් නිශ්චය කරනු ලබන අනුපාතිකයන් අනුව ආහාර දීමනාවක් ගෙවනු ලැබිය යුතු ය.

(4) නිවාඩු අනුමත කර ඇති අවස්ථාවලදී ඇතුළත වාසය කරන නිලධරයන්ට ආහාර දීමනාව ගෙවනු ලැබිය යුතු ය.

**වික්ෂේපන දීමනා**

6. ඇතුළත වාසය කිරීමට නියෝග ලැබ ඇති නිලධරයන්ට එසේ ඇතුළත වාසය කරන කාලය සඳහා පහත සඳහන් අනුපාතිකයන්ට අනුව හා කොන්දේසිවලට යටත්ව වික්ෂේපන දීමනාවක් ගෙවනු ලැබිය යුතු ය :—

(අ) ස්ථිර සේවා ස්ථානය තුළ වාසය කිරීම නියෝග ලැබ ඇති විවාහක නිලධරයකුට දිනකට රුපියල් දහයක මුදලක් ගෙවනු ලැබිය යුතු ය.

(ආ) රාජකාරි කටයුතු සම්බන්ධයෙන් ස්ථිර සේවා ස්ථානයෙන් බැහැරව වාසය කිරීමට නියෝග ලැබ ඇති විවාහක නිලධරයකුට දිනකට රුපියල් පහළොවක මුදලක් ගෙවනු ලැබිය යුතු ය.

(ඇ) ස්ථිර සේවා ස්ථානයෙන් බැහැරව වාසය කිරීම සඳහා නියෝග ලැබ ඇති අවිවාහක නිලධරයකුට එසේ බැහැරව සිටින එක් එක් පැය විසි හතරක කාලපරිච්ඡේදයක් වෙනුවෙන් දිනකට රුපියල් දහයක මුදලක් ගෙවනු ලැබිය යුතු ය.

(ඈ) තාවකාලික සේවා ස්ථානයක සිටින අවිවාහක නිලධරයකුට එසේ සිටින එක් එක් පැය විසි හතරක කාල පරිච්ඡේදයක් වෙනුවෙන් දිනකට රුපියල් දහයක මුදලක් ගෙවනු ලැබිය යුතු ය.

(ඉ) එතෙර සිටින කාලය තුළ නිලධරයන්ට වික්ෂේපන දීමනාව ගෙවනු නොලැබිය යුතු ය.

(ඊ) සංයුක්ත දීමනාව සමඟ වික්ෂේපන දීමනාව නොගෙවනු ලැබේ.

(උ) ස්ථිර සේවා ස්ථානය තුළ වාසය කිරීමට අවසර ලැබ ඇති විවාහක නිලධරයකුට වඩා අඩු අනුපාතිකය අනුව වික්ෂේපන දීමනාව ගෙවනු ලැබිය යුතු ය. "ගෙවල් කුලී උපරිමය" ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීමට ඔහු සුදුස්සකු නොවිය යුතු ය.

**ඇඳුම් දීමනා**

7. (1) නිලධරයකුට සියලුම නිල ඇඳුම් ද්‍රව්‍ය සහ ආයිත්තම් මුලින් නොමිලයේ නිකුත් කරනු ලැබිය යුතු ය. මුලින් නිකුත් කරන ලද ඒ නිල ඇඳුම් සහ ආයිත්තම් ප්‍රතිසම්පාදනය කිරීම සහ ආපසු භාරදීම් නාවික හමුදාධිපති විසින් නිශ්චය කරනු ලබන්නාවූ පරිමාණයක් සහ පදනමක් මත කරනු ලැබිය යුතුය.

(2) නිල ඇඳුම් නඩත්තු දීමනා.—යම් නිලධරයකුට ඔහු අධිකාරි පත්වීම ලබූ දිනයේ සිට මසකට රුපියල් පනහ බැගින් වූ නිල ඇඳුම් නඩත්තු දීමනා වක් ලැබීමට හිමිකම් තිබිය යුතු ය.

(3) උණුසුම් ඇඳුම් පරිෂ්කාර දීමනා.—(අ) පුහුණුව සඳහා හෝ රාජකාරි වැඩ සඳහා හෝ සමශීතෝෂ්ණ කාලාපීය රටකට පිටත්ව යන යම් නිලධරයකුට එබඳු අවස්ථා අතුරෙන් මුල් අවස්ථාවේදී නාවික හමුදාධිපති විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නිල ඇඳුම් ද්‍රව්‍ය නොමිලයේ නිකුත් කරනු ලැබිය යුතුය. කෙසේ වුව ද ඒ ද්‍රව්‍ය නිකුත් කිරීම සඳහා ඒවා ලබා ගැනීමට නොහැකි නම් ඒ ද්‍රව්‍යවල වියදම වරින්වර නිශ්චය කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් අනුව ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

(ආ) දෙවන වතාවට හෝ යම් තදනන්තර අවස්ථාවක, රාජකාරි වැඩ සඳහා හෝ පුහුණුව සඳහා හෝ සමශීතෝෂ්ණ කලාපීය රටකට පිටත්ව යන යම් නිලධරයකුට, රාජකාරි වැඩ සඳහා හෝ පුහුණුව සඳහා හෝ ඊට කලින් වතාවේදී සමශීතෝෂ්ණ කලාපීය රටකට ගොස් පෙරළා ශ්‍රී ලංකාවට පැමිණ පස් වසරක කාලයක් ගතවී ඇත්නම්, නාවික හමුදාධිපති විසින් නියම කරනු ලැබිය හැකි නිල ඇඳුම් ද්‍රව්‍ය නොමිලයේ නැවත නිකුත් කරනු ලැබිය හැකි ය. කෙසේ වුව ද ඒ ද්‍රව්‍ය ලබා ගැනීමට නොහැකි නම්, වරින්වර නිශ්චය කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් අනුව ඒ ද්‍රව්‍යවල වියදම ඒ නිලධරයාට ගෙවනු ලැබිය යුතු ය.

(4) (අ) ජනාධිපතිවරයාගේ අධිසහායක වශයෙන් හෝ අතිරේක අධිසහායක වශයෙන් හෝ ගරු චිකිත්සා වෛද්‍යවරයකු වශයෙන් හෝ ගරු ශල්‍ය වෛද්‍යවරයකු වශයෙන් හෝ නාවික හමුදාධිපතිගේ ධජලුතිනන් හෝ ලේකම් හෝ වශයෙන් පත් කරනු ලබන යම් නිලධරයකුට—

(i) නිල ඇඳුම් හා ආයිත්තම්වලට අයත් පහත සඳහන් ද, එනම් ඇගිලට්ස්, එල්ලෙන පටිය, බඳ පටිය සහ තොප්පි එක සහිත සම්පූර්ණ වූ ඇඳිපත සහ

(ii) ඔහුගේ තනතුර සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි යම් අතිරේක ඇඳුම්,

නොමිලයේ නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) යම් නිලධරයකුට මේ නියෝගයේ (අ) ඡේදයේ (i) අනුඡේදය යටතේ නොමිලයේ නිකුත් කරනු ලැබූ සියලු නිල ඇඳුම් ද්‍රව්‍ය සහ ආයිත්තම් ඔහුගේ පත්වීම අවසාන වූ විට ඒ නිලධරයා විසින් ආපසු භාරදෙනු ලැබිය යුතු ය,

අනුගාමික දීමනාව

8. (1) යම් විවාහක නිලධරයකු එතෙර පුහුණුවක් ලබමින් සිටින විට හෝ රාජකාරි වැඩ සඳහා ගොස් සිටින විට ඒ නිලධරයා අනුගාමික සේවා පහසුකම් ඇති නිවස්නයකට අනුයුක්ත කර සිටි නම්, එබඳු අවස්ථාවකදී හැර, මසකට රුපියල් එකසිය විසිපහක අනුගාමික දීමනාවක් ලැබිය යුතු ය. යම් විවාහක හෝ අවිවාහක හෝ නිලධරයකු එතෙර පුහුණුවක් ලබමින් සිටින විට හෝ රාජකාරි වැඩ සඳහා ගොස් සිටින විට අනුගාමික සේවා පහසුකම් නොමැති නිවස්නයකට අනුයුක්තව සිටින්නේ නම් ඒ දීමනාව එවැනි නිලධරයකු හට ලැබිය යුතු ය.

(2) බැහැරව සිටීමට අවසර ලැබ ඇති අවිවාහක නිලධරයකු මසකට රුපියල් එකසිය විසිපහක අනුගාමික දීමනාවක් ලැබිය යුතු ය.

මෙහෙකරු දීමනාව (නාවික හමුදාධිපතිගේ දීමනාව)

9. නාවික හමුදාධිපති අනුගාමික දීමනාවට අමතර වශයෙන් මසකට රුපියල් එකසිය විසිපහක මෙහෙකරු දීමනාවක් ලැබිය යුතු ය.

සංග්‍රහ දීමනාව

10. (1) මසකට රුපියල් හාර සියයක සංග්‍රහ දීමනාවකට නාවික හමුදාපති හිමිකම් ලැබිය යුතුය.

(2) පහත සඳහන් වර්ගවලට අයත් නිලධරයන් හට මසකට රුපියල් එකසියයක සංග්‍රහ දීමනාවක් ගෙවනු ලැබිය යුතුය.

(අ) මාණ්ඩලික ප්‍රධාන ;

(ආ) අධ්‍යක්ෂවරුන්, වැඩ බලන අධ්‍යක්ෂවරුන්, ප්‍රදේශීය කමාන්ඩර්වරුන් ;

(ඇ) වෙරළබඩ ආයතන භාර අණදෙන නිලධරයන් ; සහ

(ඈ) කොමාන්ඩර් හෝ ඊට ඉහළ නිලයට අයත් නෞකා අණදෙන නිලධරයන් ;

(3) අණදෙන නිලධර තත්ත්වය යම් නිලධරයකු භාර ගන්නා දිනෙන් ආරම්භ වී, ඒ අණදෙන නිලධර තත්ත්වය අත්හරින දිනය ද ඇතුළුව ඒ දිනය දක්වාම සංග්‍රහ දීමනාව ගෙවීම නොකඩවා කරනු ලැබිය යුතුය.

(4) නිවාඩු ලබාගැනීම නිසා හෝ රෝහල් ගතවීම නිසා හෝ තාවකාලික රාජකාරි කටයුතු සම්බන්ධයෙන් සේවා ස්ථානයෙන් බැහැරව සිටීම නිසා හෝ නොපැමිණ සිටින කාලය තුළදී යම් නිලධරයකු හට ගෙවිය යුතු සංග්‍රහ දීමනාව—

(අ) එසේ නොපැමිණ සිටින කාල පරිච්ඡේදය දින තිහක් නොඉක්මවන අවස්ථාවක අඛණ්ඩව ගෙවනු ලැබිය යුතුය ; තවද,

(ආ) එසේ නොපැමිණ සිටින කාල පරිච්ඡේදය දින තිහක් ඉක්මවන අවස්ථාවක එසේ නොපැමිණ සිටින තිස් එක් වන දිනයේදී ගෙවීම නතර විය යුතුය.

(5) නොපැමිණ සිටින කාල පරිච්ඡේදය දින තිහක් ඉක්මවීම හේතුවෙන් යම් නිලධරයකුට සංග්‍රහ දීමනාව ගෙවීම නතර කළ කල්හි, එසේ නොපැමිණ සිටින නිලධරයාගේ රාජකාරි කටයුතු තාවකාලිකව ඉටු කරන නිලධරයාට ඒ දීමනාව ගෙවනු ලැබිය හැකිය.

(6) තාවකාලිකව නොපැමිණ සිටින කාලය තුළ යම් නිලධරයෙකුට සංග්‍රහ දීමනාව අඛණ්ඩව ගෙවනු ලබන කල්හි එසේ නොපැමිණ සිටින කාලය තුළ සිදු කෙරෙන අවශ්‍ය නිල සංග්‍රහ වියදම්වලින් නාවික හමුදාධිපති විසින් නිශ්චය කරනු ලබන යම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.

විදේශ දීමනාව

11. (1) පුහුණුව සඳහා හෝ රාජකාරි කටයුතු සම්බන්ධයෙන් හෝ විදේශගතව සිටින යම් නිලධරයකු පහත සඳහන් විදේශ දීමනාවට හිමිකම් ලැබිය යුතු ය :—

(අ) නේවාසිකාගාරයට අනුයුක්තව සිටින විට ලුතිනන් කොමාන්ඩර් සහ ඉන් ඉහළ නිලධරයන්ට—මසකට රු. 200 ක් බැගින්
ලුතිනන් සහ ඉන් පහළ නිලධරයන්ට—මසකට රු. 150 ක්

(ආ) නේවාසිකාගාරයට අනුයුක්ත කර නැති කල්හි ආයතන අධ්‍යක්ෂ විමසා ලේකම්වරයා විසින් වරින්වර නිශ්චය කරනු ලබන කොන්දේසි සහ අනුපාතික අනුව නිල ඡේදයක් නොසලකා ගෙවීම් කරනු ලැබිය යුතු ය.

යම් නිලධරයකු—

(අ) පුහුණුව ලබන ස්ථානයේ හෝ රාජකාරි කටයුතු කරන ස්ථානයේ හෝ නේවාසිකාගාර පහසුකම් නොමැත්තා වූ ; හෝ

(ආ) නේවාසිකාගාරයෙහි ඉඩකඩ පහසුකම් නොමැත්තා වූ ; හෝ

(ඇ) නිවාඩු ලබා හෝ නිවාඩුවක් ගත කරමින් සිටින්නා වූ අවස්ථාවකදී පමණක් ඔහු නේවාසිකාගාරයට අනුයුක්ත කර නැති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) යම් නිලධරයකු විදේශ නේවාසිකාගාරයකට අනුයුක්තව සිටින කාලය තුල නේවාසිකාගාරයට අයකර ගන්නා ලද සියළුම අනිවාර්ය ගාස්තු නිලධරයාට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(3) වික්ෂේපන දීමනාව සහ ආහාර දීමනාව විදේශ දීමනාව සමඟ ගෙවනු නොලැබිය යුතු ය.

දුෂ්කර ලැගුම් මුදල්

12. (1) (අ) නෞකාවක හෝ යාත්‍රාවක හෝ (කිසියම් විශේෂ නෞකාවක සේවය සඳහා යොදවා ඇති අය සහ ලේඛන ගත කිරීමේ කාර්යයන්හි නිරත කණ්ඩායම්වලට අයත් අය ඇතුළුව) සේවය කරන නිලධරයන්ට දිනකට රුපියල් තුන බැගින් දුෂ්කර ලැගුම් මුදල් ගෙවනු ලැබිය යුතු ය.

(ආ) යම් නිලධරයකු රාජකාරියෙහි යෙදී සිටින ස්ථානයේ නේවාසිකාගාර සහ වාසස්ථාන පහසුකම් ද ඇතුළුව ජීවන හා නිදන සැප පහසුකම් තත්ත්වය දනින්දට සහ විවේකයට ඇති වන්නා වූ බාධාව සහ සැප පහසුකම් පිළිබඳ සමස්තයක් වශයෙන් සළකන විට රාජකාරියෙහි යෙදී සිටින නිලධරයාගේ සෞඛ්‍ය සහ සුව පහසුව කෙරෙහි ඒවා බලපාන්නේ යයි නාවික හමුදාධිපති විසින් නිශ්චය කරනු ලබන විට ශ්‍රී ලංකාවේ එවැනි ප්‍රදේශයක රාජකාරියෙහි යෙදී සිටීම සම්බන්ධයෙන් එසේ සිටින නිලධරයකුට දිනකට රුපියල් දෙක බැගින් දුෂ්කර ලැගුම් මුදල් ගෙවනු ලැබිය යුතු ය.

(2) යම් නිලධරයකු වැටුප් නොලබන කවර හෝ කාලපරිච්ඡේදයක් වෙනුවෙන් ඒ නිලධරයාට දුෂ්කර ලැගුම් මුදල් ගෙවනු නොලැබිය යුතු ය.

(3) අළුත්වැඩියා කරන කාලය තුළ දුෂ්කර ලැගුම් මුදල් ගෙවීම—නෞකාවක් අලුත්වැඩියා කරන කාලය තුල ඒ නෞකාවෙහිම වාසය කරන්නා වූ ද දුෂ්කර ලැගුම් මුදල් සඳහා හිමිකම් අහිමි කරන යම් විකල්ප ඉඩකඩ පහසුකම් නොසපයනු ලැබ ඇත්තා වූ ද නිලධරයන්ට පමණක් නෞකාව අළුත්වැඩියා කරන කාලය තුළ දුෂ්කර ලැගුම් මුදල් ගෙවනු ලැබිය යුතු ය.

(4) වැඩිකළ දුෂ්කර ලැගුම් මුදල්.—(අ) පහත සඳහන් අවස්ථාවලදී ආයතන අධ්‍යක්ෂගේ එකඟත්වය ඇතිව ලේකම්වරයා විසින් නියම් කරනු ලබන වැඩි කළ දුෂ්කර ලැගුම් දීමනාව ලබා ගැනීමට විවාහක, අවිවාහක නිලධරයන් හිමිකම් ලැබිය යුතු ය.

(i) නිලධරයා ක්‍රියාන්විත ප්‍රදේශවල සේවය සඳහා යොදවා ඇති අවස්ථාවල සහ

(ii) නෞකාවක/යාත්‍රාවක මුහුදෙහි නැවත සේවය කරන කාලය වරකට පැය දොළහ ඉක්මවන්නේ නම්, එවැනි අවස්ථාවක

(ආ) රාජකාරි කටයුතු සම්බන්ධයෙන් හෝ නිවාඩු ලැබ සිටීම නිසා හෝ යම් නිලධරයකු ක්‍රියාන්විත ප්‍රදේශයකින් බැහැරව සිටින විට වැඩිකළ දුෂ්කර ලැගුම් මුදල් ගෙවනු නොලැබිය යුතු ය.

උපදේශක වැටුප්

13. (1) යම් ප්‍රධාන පුහුණු මධ්‍යස්ථානයක දින තිහකට නොඅඩු කාලයක් සඳහා පූර්න කාලීන උපදේශක කටයුතුවල ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ අනුයුක්ත කරනු ලැබ සිටින යම් නිලධරයකුට පහත දැක්වෙන ප්‍රමාණ අනුව උපදේශක වැටුප් ගෙවනු ලැබිය යුතු ය.

(අ) අණදෙන නිලධරයන්—මසකට රු. 250 ක්

(ආ) වෙනත් නිලධරයන්—මසකට රු. 200 ක්

(2) උපදේශක නොවන රාජකාරිවලට අමතර වශයෙන් උපදේශක රාජකාරි ඉටු කිරීම සඳහා (1) වන ඡේදය යටතේ පුහුණු මධ්‍යස්ථානයක උපදේශක රාජකාරිවල නිරත නිලධරයෙක් උපදේශක වැටුපෙන් අඩක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

සුදුසුකම් වැටුප්

14. යම් නිලධරයකු—

(අ) (i) සේවයට විශේෂ වටිනාකමක් ඇති පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ඇති බවට ;

(ii) සේවයට විශේෂ වටිනාකමක් ඇත්තා වූ විෂයයකින් පිළිගත් විශ්ව විද්‍යාලයක ගෞරව උපාධියක් ලබා තිබෙන බවට ;

(iii) පොදු හෝ ශිල්පීය ඩිප්ලෝමාවක් හෝ සහතිකයක් ලබා ඇති බවට ;

(iv) ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල පාඨමාලාවක් හෝ විශේෂඥ පාඨමාලාවක් හදාරා සුදුසුකම් ලබා ඇති බවට

හෝ

(v) සේවාවට වටිනාකමක් ඇත්තා වූ විශේෂ දැනුමක් ලබාදෙන සේවා පාඨමාලාවක දී සුදුසුකම් ලබා ඇති බවට ;
නාවික හමුදාධිපති සහ ලේකම් සෑහීමකට පත්වූ අවස්ථාවක, ඒ නිලධරයා පහත දක්වා ඇති අනුප්‍රමාණ අතුරෙන් තමාට උචිත අනුප්‍රමාණයක් අනුව සුදුසුකම් වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය ;

(අ) (i), (ii), (iv) සහ (v) ඡේදවල සඳහන් සුදුසුකම් සම්බන්ධයෙන් මසකට රු. 300 ක්.

(ආ) (iii) ඡේදයේ සුදුසුකම් සම්බන්ධයෙන් මසකට රු. 200 ක්.

(ආ) අදාල කළ යුතුයයි කලින් කල පිළිගනු ලබන සුදුසුකම්, පාඨමාලා නාවික හමුදාධිපති සහ ආරක්ෂක අමාත්‍යාංශයේ සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ එක් එක් නියෝජිතයකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් නිශ්චය කරනු ලැබිය යුතුය,

වෙනත් දීමනා

15. (1) විධාන මුදල්.—පහත සඳහන් වර්ගවලට අයත් නිලධරයන්ට විධාන දීමනා ගෙවනු ලැබිය යුතු ය:—

(අ) (i) නාවික හමුදාධිපති ;

(ii) මුහුදු ගමන්වල යෙදෙන ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් නෞකාවල සහ යාත්‍රාවල අණදෙන නිලධාරින් සහ අණභාර නිලධාරීන් ;

(iii) නාවික හමුදා කාර්ය මෙහෙයුම් සහ ඒවායේ සැලැස්ම, පාලනය, සහ අධීක්ෂණය පිළිබඳව සම්පූර්ණ අණදීම් භාරව සිටින/කාර්ය භාර සහ එවැනි මෙහෙයවීම් සම්බන්ධයෙන් වගකිවයුතු විධායක අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්.

(ආ) නාවික හමුදාධිපතිට විධාන මුදල් වශයෙන් මසකට රු. 300 බැගින් ගෙවනු ලබන අතර, අනෙක් අයට ඒ නිලධරයාගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට හය බැගින් විධාන දීමනා ලැබෙනු ඇත.

(ඇ) විධාන මුදල් ගෙවනු ලැබිය යුතු නෞකා ලේකම්ගේ අනුමතිය ඇතිව නාවික හමුදාධිපති විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය යුතු ය.

(ඇ) විධාන මුදල් ගෙවීම අණදෙන කාර්ය බාර ගන්නා දිනයේ ආරම්භ වියයුතු අතර ඒ අණදීමේ කාර්යය අත්හරින දිනය ඇතුළුව ඒ දිනය දක්වා නොකඩවා ගෙවීම කරනු ලැබිය යුතු ය.

(ඉ) යම් නිලධරයකු නිවාඩු ලබා සිටින හෝ අසනීපව සිටින හෝ කාලය තුළ ඒ දීමනාව වෙනත් නිලධරයකුට නොගෙවනු ලබන්නේ නම් සහ නිලධරයා ආපසු පැමිණ රාජකාරි වැඩ යළි ආරම්භ කරන්නේ නම් විධාන මුදල් අඛණ්ඩව ගෙවනු ලැබිය හැකි ය.

(ඊ) අණදීමේ කාර්යය වෙනස් කිරීම්වලදී අණදීමේ කාර්යය නතර කරන දිනය හෝ ඉන් ඔබ්බට යන කාලපරිච්ඡේදය හෝ වෙනුවෙන් වූ විධාන මුදල් අණදීමේ කාර්යය අත්හැර යන නිලධාරයාට පමණක් ගෙවනු ලැබිය යුතු ය.

(උ) එකම අණදීමේ කාර්යය සඳහා නිලධරයන් දෙදෙනෙකුට එකවර විධාන මුදල් ගෙවනු නොලැබිය යුතු ය.

(2) කිමිදුම් වැටුප්.—සුදුසුකම ලබා ඇති කිමිදුම්කරුවන්ට, ඇත්ත වශයෙන්ම ඔවුන් කිමිදුම් කටයුතුවල නියුතුවන දිනවලදී දිනකට රුපියල් පහ බැගින් කිමිදුම් වැටුප් ගෙවනු ලැබිය යුතු ය.

### මධ්‍ය නිලධරයන්ගේ සහ ශිෂ්‍යභට නිලධරයන්ගේ වැටුප්

වැටුප්

16. මධ්‍ය නිලධරයකුගේ වාර්ෂික ඒකාබද්ධ වැටුප රු. 11,580 ක් විය යුතු අතර, ශිෂ්‍යභට නිලධරයකුගේ වාර්ෂික ඒකාබද්ධ වැටුප රු. 11,220 ක් විය යුතු ය. මධ්‍ය නිලධරයකු හෝ ශිෂ්‍යභටයකු වශයෙන් වූ සිය සේවා කාලය තුලදී මධ්‍ය නිලධරයකු හෝ ශිෂ්‍යභට නිලධරයකු වැටුප් වර්ධක කිසිවකට හිමිකම් නොලැබිය යුතු ය.

### මධ්‍ය නිලධරයන්ගේ සහ ශිෂ්‍යභට නිලධරයන්ගේ දීමනා

ආහාර සැපයීම

17. නේවාසිකාගාරයෙහි නවාතැන් ගෙන සිටින මධ්‍ය නිලධරයකුට සහ ශිෂ්‍යභට නිලධරයකුට නාවික හමුදාධිපති විසින් නිශ්චය කරනු ලැබිය හැකි නාවික හමුදා විධිවිධාන යටතේ ආහාර ලබාදිය යුතු ය.

ඇඳුම් හිටුම

18. මධ්‍ය නිලධරයන්ට සහ ශිෂ්‍යභට නිලධරයන්ට නොමිලේ ඇඳුම්හිටුම් සපයනු ලැබිය යුතු ය.

විදේශ දීමනාව

19. (1) විදේශයක පුහුණුව ලබන හෝ රාජකාරි කරන හෝ මධ්‍ය නිලධරයකු හෝ ශිෂ්‍යභට නිලධරයකු හෝ පහත සඳහන් විදේශ දීමනාවට හිමිකම් ලැබිය යුතු ය :—

(අ) නේවාසිකාගාරයට අනුයුක්ත කර ඇති කාලය තුළ මසකට රු. 100/-ක්.

(ආ) නේවාසිකාගාරයට අනුයුක්ත නොකර ඇති කාලය තුළ ආයතන අධ්‍යක්ෂ විසො ලේකම්වරයා විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් අනුප්‍රමාණවලට අනුව සහ කොන්දේසිවලට යටත්ව.

(2) මධ්‍ය නිලධරයකු හෝ ශිෂ්‍යභට නිලධරයකු—

(අ) පුහුණුව ලබන හෝ රාජකාරි කරන ස්ථානයෙහි නේවාසිකාගාර පහසුකම් නොමැති විටෙක ; හෝ

(ආ) නේවාසිකාගාරයෙහි ඉඩකඩ නොමැති විටෙක ; හෝ

(ඇ) තමා නිවාඩු ලබා සිටින හෝ නිවාඩුවක් ගත කරමින් සිටින විටෙක පමණක්

නේවාසිකාගාරයට අනුයුක්තව නැති ලෙස සලකනු ලැබිය යුතුය.

(3) විදේශ රටක නේවාසිකාගාරයකට අනුයුක්තව සිටින අතරතුර මධ්‍ය නිලධරයකුගෙන් හෝ ශිෂ්‍යභට නිලධරයකුගෙන් හෝ ඒ නේවාසිකාගාරය විසින් අයකරනු ලබන සියලු අනිවාර්ය ගාස්තු ඒ මධ්‍ය නිලධරයා හෝ ශිෂ්‍යභට නිලධරයා වෙත ප්‍රතිපූර්ණය කරනු ලැබිය යුතුය.

ඇඳුම්

20. (1) මධ්‍ය නිලධාරයකු හෝ ශිෂ්‍යභට නිලධරයකු හෝ වශයෙන් සේවය කරන කාලය තුල මධ්‍ය නිලධරයකුගේ හෝ ශිෂ්‍යභට නිලධරයකුගේ හෝ සියලු නිල ඇඳුම් හා ආයිත්තම් නාවික හමුද වේ වියදමින් ඔවුනට සපයනු ලැබිය යුතුය.

(2) පුහුණුව සඳහා හෝ, රාජකාරි සඳහා හෝ, සමශීතෝෂ්ණ කලාපිය රටකට පිටත්ව යන මධ්‍ය නිලධරයකුට හෝ ශිෂ්‍යභට නිලධරයකුට හෝ නිල ඇඳුමින් සැරසී යාමට ඒ රටේ අවසර දී නොමැති නම්, නාවික හමුදාධිපති විසින් නියම කරනු ලැබිය හැකි සිවිල් ඇඳුම් ඒ මධ්‍ය නිලධරයාට හෝ ශිෂ්‍යභට නිලධරයාට හෝ නොමිලයේ නිකුත් කරනු ලැබිය යුතුය. එසේ නිකුත් කිරීම සඳහා ඒ සිවිල් ඇඳුම් ලබාගත නොහැකි නම්, ඇඳුම්වල වියදම වරින්වර නිශ්චය කරනු ලබන ගාස්තු ප්‍රමාණ අනුව ඒ මධ්‍ය නිලධරයාට හෝ ශිෂ්‍යභට නිලධරයාට ගෙවනු ලැබිය යුතුය.

(3) නිල ඇඳුම් නඩත්තු දීමනාව—මධ්‍ය නිලධරයකු හෝ ශිෂ්‍යභට නිලධරයකු හෝ තමා බැඳුන දිනසිට මසකට රුපියල් පණහක නිල ඇඳුම් නඩත්තු දීමනාවක් ලැබීමට හිමිකම් ලැබිය යුතුය.

වෙනත් දීමනා

21. (1) දුෂ්කර ලැගුම් දීමනාව.—මේ නියෝගවල 12 වන නියෝගයෙහි නිලධරයන්ට අදාළව බහා ඇති කොන්දේසි යටතේම මධ්‍ය නිලධරයන්ට සහ ශිෂ්‍යභට නිලධරයන්ට දුෂ්කර ලැගුම් දීමනා ගෙවනු ලැබිය යුතුය.

(2) වැඩි කළ දුෂ්කර ලැගුම් දීමනාව.—නිලධරයන් සම්බන්ධයෙන් මේ නියෝගවල 12 වන නියෝගයෙහි නිලධරයන්ට අදාළව බහා ඇති කොන්දේසි යටතේම මෙහෙයුම් ප්‍රදේශවලට අනුයුක්තව සිටින මධ්‍ය නිලධරයන්ට වැඩි කළ දුෂ්කර ලැගුම් දීමනාව ගෙවනු ලැබිය යුතුය. වැඩිකළ දුෂ්කර ලැගුම් දීමනාව ලැබීමට ශිෂ්‍යභට නිලධරයන්ට හිමිකම් නොතිබිය යුතුය.

## 11 වන කොටස—නැවියන්

### නැවියන්ගේ වැටුප්

22. (1) නැවියකුගේ ස්ථිර තරාතිරම සම්බන්ධයෙන් ඔහුට අදාළ ඒකාබද්ධ වැටුප් පරිමාණය පහත සඳහන් පරිදි විය යුතුය :—

ආධුනික නැවි — වසරකට රු : 8,460—වැටුප් වර්ධක නොමැත.

### 111 වන ගණය

| | |
|---|---|
| සාමාන්‍ය නැවි හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 8,460 කින් ආරම්භ වී එකක් රු : 180 බැගින් වූ වැටුප් වර්ධක 15 කින් රු : 11,160 දක්වා වැඩිවේ. |
| මල නැවි හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 8,700 කින් ආරම්භ වී එකක් රු : 180 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක 15 කින් රු : 11,400 දක්වා වැඩිවේ. |
| නායක නැවි හෝ ඒ හා සමාන නිලය | ... වසරකට රු : 9,600 කින් ආරම්භ වී එකක් රු : 180 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක 15 කින් රු : 12,300 දක්වා වැඩිවේ. |
| සුළු නිලධර හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 11,040 කින් ආරම්භ වී එකක් රු : 240 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක 10 කින් රු : 13,440 දක්වා වැඩි වේ. |
| ප්‍රධාන සුළු නිලධර හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 11,640 කින් ආරම්භ වී එකක් රු : 240 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක 10 කින් රු : 14,040 දක්වා වැඩි වේ. |
| මාලක ප්‍රධාන සුළු නිලධර හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 13,560 කින් ආරම්භ වී එකක් රු. 360 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක 5 කින් රු : 15,360 දක්වා වැඩිවේ. |

### 11 වන ගණය

| | |
|---|---|
| සාමාන්‍ය නැවි හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 8,580 කින් ආරම්භ වී එකක් රු : 180 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක 15 කින් රු : 11,280 දක්වා වැඩිවේ. |
| මල නැවි හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 8,880 කින් ආරම්භ වී එකක් රු. 180 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක 15 කින් රු : 11,580 දක්වා වැඩිවේ. |
| නායක නැවි හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 9,780 කින් ආරම්භ වී එකක් රු. 180 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක 15 කින් රු : 12,480 දක්වා වැඩිවේ. |
| සුළු නිලධර හෝ සමාන නිලය | — වසරකට රු : 11,220 කින් ආරම්භ වී එකක් රු : 240 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක දහයකින් රු : 13,620 දක්වා වැඩි වේ. |
| ප්‍රධාන සුළු නිලධර හෝ සමාන නිලය | — වසරකට රු : 11,880 කින් ආරම්භ වී එකක් රු : 240 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක දහයකින් රු : 14,280 දක්වා වැඩිවේ. |
| මාලක ප්‍රධාන සුළු නිලධර හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 14,160 කින් ආරම්භ වී එකක් රු : 360 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක පහකින් රු : 15,960 දක්වා වැඩි වේ. |

### 1 වන ගණය

| | |
|---|---|
| සාමාන්‍ය නැවි හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 8,700 කින් ආරම්භ වී එකක් රු : 180 බැගින්වූ වාර්ෂික වැටුප් වර්ධක පහළොවකින් රු : 11,400 දක්වා වැඩි වේ. |
| මල නැවි හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 9,060 කින් ආරම්භ වී එකක් රු : 180 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක පහළොවකින් රු : 11,760 දක්වා වැඩි වේ. |
| නායක නැවි හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 10,140 කින් ආරම්භ වී එකක් රු : 180 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක පහළොව කින් රු : 12,840 දක්වා වැඩි වේ. |
| සුළු නිලධර හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 11,400 කින් ආරම්භ වී එකක් රු. 240 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක දහයකින් රු : 13,800 දක්වා වැඩිවේ. |
| ප්‍රධාන සුළු නිලධර හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 12,120 කින් ආරම්භ වී එකක් රු. 240 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක දහයකින් රු : 14,520 දක්වා වැඩිවේ. |
| මාලක ප්‍රධාන සුළු නිලධර හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 14,520 කින් ආරම්භ වී එකක් රු : 360 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක පහකින් රු : 16,320 දක්වා වැඩිවේ. |

### විශේෂ ගණය

| | |
|---|---|
| මල නැවි හෝ ඒ හා සමාන නිලය | — වසරකට 9,240 කින් ආරම්භ වී එකක් රු. 180 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක පහළොවකින් රු : 11,940 දක්වා වැඩිවේ. |
| නායක නැවි හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 10,500 කින් ආරම්භ වී එකක් රු : 180 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක පහළොව කින් රු: 13,200 දක්වා වැඩිවේ. |
| සුළු නිලධර හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 12,120 කින් ආරම්භ වී එකක් රු. 240 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක දහයකින් රු : 14,520 දක්වා වැඩිවේ. |
| ප්‍රධාන සුළු නිලධාරී හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 12,660 කින් ආරම්භ වී එකක් රු : 240 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක දහයකින් රු : 15,060 දක්වා වැඩිවේ. |
| මාලක ප්‍රධාන සුළු නිලධාරී හෝ ඒ හා සමාන නිලය | — වසරකට රු : 14,880 කින් ආරම්භ වී එකක් රු : 360 බැගින් වූ වාර්ෂික වැටුප් වර්ධක පහකින් රු : 16,680 දක්වා වැඩිවේ. |

(2) නැවියකු ඉහළ තරාතිරමකට උසස් කිරීමේදී හෝ පහළ ගණයකින් ඉහළ ගණයකට උසස්—ශ්‍රේණි කිරීමේදී හෝ ඔහුගේ වැටුප් ආයතන සංග්‍රහයේ vii වන පරිච්ඡේදයේ 5 වන වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාර නිශ්චය කරනු ලැබිය යුතුය.

(3) කිසිම නැවියකු—

(අ) ආයතන සංග්‍රහයේ නියමිත සුදුසුකම් තමා සතුව ඇතිනම්; සහ

(ආ) ආයතන සංග්‍රහයේ සඳහන් පරිදි රාජ්‍ය භාෂාවෙන් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයන් සමත් වී ඇත්නම්,

මිස, තම ප්‍රමාණ නියමයට උචිත වැටුප් වර්ධක නොලැබිය යුතුය.

(4) (අ) මෙහි (ආ) අනුඡේදයෙහි සඳහන් හේතූන් මත හැර වෙනත් කවර හෝ හේතූන් මත නාවික රාජකාරි කටයුතුවල යෙදීම අත්හිටුවනු ලැ ඇති යම් නැවියකු හට එසේ අත්හිටුවනු ලැබ සිටින එක් එක් මාසය වෙනුවෙන් ඔහුගේ මුළු වේතන වලින් අඩක් පමණක් ගෙවනු ලැබිය යුතුය ;

එසේ වුවද, තම වේතන වලින් අඩකට වඩා වැඩි අනුපාතිකයක් එවැනි නැවියකු හට ගෙවීම සඳහා වූ බලය, සිය අභිමතය පරිදි ලේකම්වර විසින් දෙනු ලැබිය හැකිය.

(ආ) තමාට එරෙහිව—

(I) රජයට පාඩුවක් වන අන්දමට; රජයට හෝ නාවික හමුදාවට හෝ අයත් දේපළක් වංචාවෙන් අත්කරගැනීම හෝ වංචාවක් හෝ හෝ අක්සන් තැබීමක් හෝ ඒ හා සමාන වෙනත් වරදක් කර හෝ කර ඇති බවට මුල් බැල්මට ඔප්පු කරනු ලැබ ඇත්තා වූ ; හෝ

(II) අල්ලස් ගැනීමක් හෝ වෙනත් මාර්ගයකින් නීති විරෝධි ලෙස ප්‍රයෝජනයක් ලබා ඇත්තා වූ බවට මුල් බැල්මට ඔප්පු කරනු ලැ ඇත්තා වූ නැවියකුට, නාවික රාජකාරි වල යෙදීමෙන් අත්හිටුවනු ලැබ ඇති විට, එසේ අත්හිටුවනු ලැබූ දිනයේ සිට වේතන කිසිවක් නොලැබිය යුතු එවැනි සෑම අවස්ථාවකදීම ඒ අත්හිටුවීමේ නියමය ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතුය.

(ඇ) (ආ) අනුඡේදයෙහි සඳහන් යම් හේතූන් මත නැවියකු රාජකාරියෙහි යෙදීම අත්හිටුවනු ලැබ, ඔහුට විරුද්ධව විනයානුකූල කටයුතු එ වයරක කාලසීමාවක් තුළදී අවසාන නොකරනු ලබන්නාවූද, එසේම ලේකම්ගේ මතය පරිදි අවස්ථාවට අදාළ කරුණු නැවියාගේ වේතන ගෙවීම තවදුරට අත්හිටුවීම යුක්ති සහගත කාර්යයක් වීමට තරම් බරපතළ නොවන්නාවූද අවස්ථාවක; ඉහත කී එක් වසර ඉකුත් වූ පසුව සහ ඊට අනතුරුව සේවය අත්හි වනු ලැබූ නැවියා හේතුකොට ගෙන හෝ ඔහුගේ ඉල්ලීම පිට හෝ විනයානුකූල කාර්ය කල් දැමීම නිසා ඇතිවූ ප්‍රමාදවීම ගැන සලකා ලේකම් විසි නිශ්චය කරනු ලබන්නා වූ යම් වැඩිදුර කාල පරිච්ඡේදයකට පසුව, ඒ නැවියාගේ සම්පූර්ණ මාසික වේතනවලින් අඩකට වැඩි නොවන ප්‍රමාණයක් ගෙවී සඳහා ආයතන අධ්‍යක්ෂගේ එකඟත්වය ඇතිව ලේකම්වරයා විසින් බලය දෙනු ලැබිය හැකිය.

(ඈ) යම් නැවියකු, සිය නාවික රාජකාරි වල යෙදීම අත්හිටුවනු ලැබ ඇති විට එසේ අත්හිටුවනු නොලැබුයේ නම්, මේ වැටුප් සංග්‍රහයෙහි සඳහ වෙනත් යම් විධිවිධාන යටතේ ලැබීමට සුදුසුකම් ඇති වන්නට ඉඩ තිබුණ කවර හෝ වැටුප් වර්ධකයක් එවැනි නැවියකු විසින් නොලැබිය යුතුය ;

එසේ වුවද, එවැනි නැවියකු පසුව සේවයෙහි නැවත පිහිටුවනු ලැබූ විට රාජකාරි කටයුතුවල යෙදීම අත්හිටුවනු නොලැබුයේ නම්, මේ වැටුප් සංග්‍ර යටතේ ඔහුට ලැබීමට හිමිකම් ඇතිවිය හැකිව තිබූ වැටුප් වර්ධක සියල්ලම ඔහුට ගෙවනු ලැබිය හැකිය.

(ඉ) සිය නාවික රාජකාරි කටයුතුවල යෙදීම අත්හිටුවනු ලැබූ යම් නැවියකු නැවත සේවයෙහි පිහිටුවනු ලැබූ විට, එසේ රාජකාරි කටයුතුව යෙදීම අත්හිටුවනු ලැබ සිටි කාලය තුළ නොගෙවා නතර කර ගන්නා ලද සම්පූර්ණ වේතන එම නැවියා හට ගෙවනු ලැබිය හැකිය.

(ඊ) නාවික හමුදා රාජකාරි වල යෙදීම අත්හිටුවනු ලැබ ඇති යම් නැවියකු (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත්කර ලැබ ඇත්තාවූ යම් පරීක්ෂණ කොමිෂන් සභාවක් මගින් හෝ නාවික හමුදා හෝ සිවිල් අධිකරණයක් මගින් හෝ අවස්ථාවෝචිත පරිදි, නාවික හෝ සිවි වරදක් වන යම් ක්‍රියාවක් හෝ ක්‍රියා කර ඇති බවට නිගමනය කරනු ලැබ ඇත්නම් සේවය අත්හිටුවනු ලැබ සිටි කාලයතුළදී නොගෙවා නතර කර ගන්න ලද වේතන හෝ ඉන් කවර හෝ කොටසක් හෝ ඔහුට ගෙවනු නොලැබිය යුතුය.

එසේ වුවද, එවැනි යම් නැවියකු විසින් කරනු ලැබ ඇති යම් ක්‍රියාවක් ඔහු සේවයෙන් පහකරනු ලැබීමට තරම් බරපතළ නොවන සුළු වරදක් හෙ විෂමාචාරය පිළිබඳ වරදක් හෝ බව එවැනි කොමිෂන් සභාවක් හෝ අධිකරණයක් හෝ මගින් නිගමනය කරනු ලැබ ඇති කල්හි, සහ ඉහත (අ) අනුඡේ දය අනුව ඒ නැවියාගේ අඩුකර ගන්නාලද මුදල් ප්‍රමාණය අවස්ථානුගත කරුණු අනුව බරපතළ දඬුවමක් ලෙස ලේකම් විසින් සළකනු ලැබ ඇති කල් එසේ රාජකාරියෙහි යෙදීම අත්හිටුවනු ලැබ සිටි කාලය තුළ නොගෙවා නතර කර ගන්නා ලද සම්පූර්ණ වේතන ප්‍රමාණය හෝ එම කාලය තුළ ගෙව ලැබූ අනුපාතිකයට වඩා වැඩි අනුපාතිකයක් හෝ ඒ නැවියාට ගෙවන ලෙස ලේකම් විසින් විධාන කරනු ලැබිය හැකිය.

23. 22 වන නියෝගයේ කාර්යය සඳහා නාවික හමුදාධිපති විසින් කලින් කල නිශ්චය කරනු ලබන පරිදි, නැවියන් ආධුනික ගණය, I, II, II සහ විශේෂ ගණය වශයෙන් ගණ පහකට වර්ග කරනු ලැබිය යුතුය.

වැඩ බලන වැටුප :—

24. (1) යම් නැවියකු වඩා ඉහළ තරාතිරමකට අයත් තනතුරක් ඒ තනතුර ස්ථිර වශයෙන් යම් තැනැත්තකු විසින් නොදරන කාලපරිච්ඡේදය, තු හෝ ඒ තනතුරට ස්ථිර වශයෙන් පත්කරනු ලැබ ඇති තැනැත්තා නොපැමිණ සිටින කාලපරිච්ඡේදය තුළ හෝ වැඩ බැලීම සඳහා නාවික හමුදාධිපති විසි පත් කරනු ලැබ එම නැවියා ඒ තනතුරෙහි යටත් පිරිසෙයින් දෙමසක අවම කාලපරිච්ඡේදයක් තුළ වැඩ බැලීම කර ඇත්නම්, ඒ නැවියා හට වැඩ බැලීම වැටුප ගෙවනු ලැබිය යුතුය.

(2) (1) වන ඡේදයේ විධිවිධාන වලට අනුකූලව, වැඩ බැලීම සඳහා පත්කරනු ලැබ ඇති නැවියකු වැඩ බැලීමේ පත්වීම දරන රාජ්‍ය නිලධරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ ආයතන සංග්‍රහයේ අඩංගු විධිවිධාන යටතේ ගණන් බලන අන්දමට වැඩබලන වැටුප් ලැබිය යුතුය.

25. නැවියකුගේ වැටුප් වර්ධක කාර්ය සඳහා ගණන් ගත යුතු සේවය —

(1) (අ) රාජකීය ලංකා නාවික හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ ස්ථිර තරාතිරමක පූර්ණ වැටුප් සහිතව ඉටු කරන ලද මු සේවා කාලය ;

(ආ) රාජකීය ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික බලකායේ සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ එම නිලයෙහිම හෝ ඊට වඩා ඉහළ නිලයක හෝ නාවික හමුදාවට බැඳීමෙන් පසුව පමණක් ඉටු කරන ලද පූර්ණ වැටුප් සහිත මුළු සේවා කාලය

විය යුතුය.

(2) පහත සඳහන් සේවා හැර ත්‍රිතානය පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් සන්නද්ධ බලකාය වල සහ ලංකා ආරක්ෂක බලකාය වල සහ ශ්‍රී ලං ආරක්ෂක බලකාය වල නෙමයකට අධික අන්තර්ගත කරනු ලැබූ හෝ සක්‍රිය සේවය යටතේ හෝ පෙර සේවය හෝ රාජකීය නාවි පොලිසියෙහි පූර්ණ වැටුප් සහිත සේවය සහ යම් නැවියකු රාජකීය නාවික හමුදාවට හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ බඳවා ගනු ලැ තරාතිරමම දරමින් හෝ ඊට වඩා උසස් තරාතිරමක් දරමින් හෝ ආරක්ෂක බලකායන් පිළිබඳ ආඥපනත යටතේ පිහිටුවනු ලැබූ ආරක්ෂ බලකායෙහි ස්ථිර කාර්ය මණ්ඩලයක සාමාජිකයකු වශයෙන් කළ සේවය—

(අ) යුද්ධාධිකරණයක් මගින් පැනයාමේ චෝදනාව සම්බන්ධයෙන් නඩු විභාගයක් නොපවත්වනු ලැබ හෝ එවැනි නඩු විභාගයක් අති නොහරිනු ලැබ නැවියා පැනගිය තත්ත්වයෙන් සිටින්නේ යයි ප්‍රකාශයට පත් කර සිටිය දී අවසන් කරනු ලැබූ පෙර සේවාව ;

(ආ) නිත්‍ද සහගත අස්කිරීම නිසා හෝ සිවිල් අධිකරණයක් මගින් වරදකරු කිරීම නිසා හෝ විෂමාචාරය සම්බන්ධයෙන් ලසු නඩු විභාගයකින් පසුව හෝ යුද්ධාධිකරණ නඩු විභාගයකින් පසුව හෝ විෂමාචාරය හේතුකොට ගෙන සේවය තවදුරටත් අවශ්‍ය නොවන නිසා හෝ අවසන් කරනු ලැබූ සේවය ;

(ඇ) විෂමාචාරය හේතුකොට අවසන් කරනු ලැබූ අධිකාරිලත් නිලධරයකු වශයෙන් වූ පෙර සේවාව ;

(ඈ) වැටුප් අහිමි කරනු ලැබූවා වූ දින විසි අටකට වැඩි කවර හෝ අඛණ්ඩ කාල පරිච්ඡේදයක් ;

(ඉ) පැනයාමේ හෝ වංචනික ලෙස හමුදාවට බැඳීමේ හෝ හේතුව නිසා අහිමි කරනු ලැබ එවකට බල පැවැත්වෙන නියෝග අනුව යළිත් එය ලබා දෙනු නොලැබුවේ නම්, එබඳු සේවා කාලයක්.

(3) තාවකාලික හෝ වැඩ බැලීමේ හෝ තරාතිරම දැරීමට පෙර දැරූ ස්ථිර තරාතිරමේ සේවා කාලය සම්බන්ධයෙන් පමණක්වන වඩා ඉහළ තරාතිරමක තාවකාලික හෝ වැඩ බැලීමේ හෝ සේවා කාලය.

(4) ශ්‍රී ලංකා රජයේ අනුමතිය ඇතිව ස්ථාපනය කරනු ලැබූ මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ යම් තනතුරක සේවය සඳහා රජයේ නිලධරයකු වශයෙන් රජය සම්බන්ධයෙන් ද්විතියනය කරනු ලැබූ නැවියකු වශයෙන් වූ සේවා කාලය.

නැවත බැඳීමේ වැටුප

26. (1) මුල් බඳවා ගැනීම යටතේ වසර දොළහක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසුව දස වසරක කාලයක් සේවය කිරීම සඳහා නැවත බැඳෙන නැවියකු හට තමාට උචිත වැටුපකට අමතරව, නැවත බැඳීමේ වැටුප වශයෙන් විශ්‍රාම වැටුප් හිමිකම් සහිත, වසරකට රු. 1,500/—ක මුදලක් ගෙවනු ලැබිය යුතුය.

(2) කෙසේ වුවද, පුහුණු පාඨමාලාවක් හැදෑරීම සම්බන්ධයෙන් ගිවිසගත් බැඳුම්කරයක් /ගිවිසුමක් යටතේ හෝ වෙනත් සේවා අවශ්‍යතාවයක් නිසා හෝ ගත යුතු අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ කිරීමේ කාර්යය සඳහා යම් නැවියකු දස වසරකට අඩු කාලයක් සඳහා නැවත බැඳී ඇත්නම් මෙහි කලින් විධිවිධානවල කුමක් සඳහන් වුවද, ඔහුට ඒ නැවත බැඳීමේ වැටුප ගෙවනු ලැබිය හැකිය.

## නැවියන්ගේ දීමනා

ආහාර සැපයීම

27. (1) නේවාසිකාගාරයක වාසය කරන අවිවාහක නැවියකු හටද නේවාසිකාගාරයක විසීමට නියෝග ලැබ ඇත්තාවූ හෝ එසේ විසීමට අවසර ලැබ ඇත්තා වූ හෝ විවාහක නැවියකු හටද නාවික හමුදා විධිවිධාන යටතේ ආහාර සපයනු ලැබිය යුතුය.

(2) එවැනි නැවියකු හට සැපයිය යුතු ආහාර සළාක පරිමාණය ලේකම් වරයාගේ අනුමතය ඇතිව නාවික හමුදාපති විසින් වරින්වර නිශ්චය කරනු ලබන පරිදි විය යුතුය.

(3) ඇතුළත වාසය කරන සියලුම නැවියන්ට අනුමත නිවාඩු පිට සිටින අවස්ථාවලදී ආහාර දීමනාවක් ගෙවනු ලැබිය යුතුය.

(4) බැහැර විසීමට බලයදී ඇති යම් නැවියකුහට නාවික හමුදාපති විසින් වරින්වර අනුමතකරනු ලබන අනුප්‍රමාණ පරිදි සළාක දීමනාව ගෙවනු ලැබිය යුතුය.

වික්ෂේපන දීමනා

28. (1) ඇතුළත විසීමට නියෝග ලැබ ඇති නැවියකු හට පහත සඳහන් අනුප්‍රමාණ පරිදි වික්ෂේපන දීමනාව ගෙවනු ලැබිය යුතුය :—

(අ) සිය ස්ථිර සේවා ස්ථානයෙහි විසීමට නියෝග ලැබ ඇති විවාහක නැවියකු හට දිනකට රු. 5 බැගින් ගෙවනු ලැබිය යුතුය.

(ආ) රාජකාරි සම්බන්ධයෙන් සිය ස්ථිර සේවා ස්ථානයෙන් බැහැරව විසීමට නියෝග ලැබ ඇති විවාහක නැවියකු හට දිනකට රු. 7.50 බැගින් ගෙවනු ලැබිය යුතුය.

(ඇ) රාජකාරි සම්බන්ධයෙන් සිය ස්ථිර සේවා ස්ථානයෙන් බැහැරව විසීමට නියෝග ලැබ ඇති යම් අවිවාහක නැවියකු හට දිනකට රු. 5 බැගින් ගෙවනු ලැබිය යුතුය.

(ඈ) තාවකාලික සේවා ස්ථානයක අවිවාහක නැවියකු හට දිනකට රු. 5 බැගින් ගෙවනු ලැබිය යුතුය.

(2) යම් නැවියෙකු එතෙර සිටින අතරතුර වික්ෂේපණ දීමනාව ගෙවනු නොලැබිය යුතුය.

(3) සංයුක්ත දීමනාව, වික්ෂේපන දීමනාව සමඟ එකවිට ගෙවනු නොලැබිය යුතුය.

(4) ස්ථිර සේවා ස්ථානයෙහි විසීමට අවසර දෙනු ලැබ ඇති විවාහක නැවියකුහට වඩා අඩු අනු ප්‍රමාණයකට වික්ෂේපන දීමනාව ගෙවනුලැබිය යුතුය. ඔහු ගෙවල් කුලී උපරිම සීමා ක්‍රමයේ ප්‍රතිලාභවලට හිමිකම් නොලැබිය යුතුය.

ඇඳුම්

29. (1) පරිෂ්කාර දීමනාව—නිල ඇඳුම් සහ ආයිත්තම් මිළයට ගැනීම සඳහා පරිෂ්කාර දීමනාවක් නැවියකු හට ගෙවනු නොලැබිය යුතුය. නැවියකු වශයෙන් සිය සේවා කාලය තුළදී සියලු නිල ඇඳුම් සහ ආයිත්තම් නාවික හමුදාවේ වියදමින් ඔහුට සපයනු ලැබිය යුතුය.

(2) නිල ඇඳුම් නඩත්තු දීමනාව.—තමා සේවයට බැඳුන දින සිට, මසකට රු. 50 බැගින් වූ නිල ඇඳුම් නඩත්තු දීමනාවක් ලැබීමට නැවියකු හිමිකම් ලැබිය යුතුය.

(3) උණුසුම් ඇඳුම් පරිෂ්කාර දීමනාව.—(අ) පුහුණුව හෝ රාජකාරි සම්බන්ධයෙන් හෝ සමශීතෝෂ්ණ කලාපීය රටකට පිටත්ව යන නැවියකු හට නාවික හමුදාපති විසින් නිශ්චය කරනු ලැබිය හැකි ඇඳුම්වලට අයත් යම් ආයිත්තම්, ඔහු එසේ යන පළමු අවස්ථාවේදී නොමිලයේ නිකුත් කරනු ලැබිය යුතුය. කෙසේ වුවද නිකුත් කිරීම සඳහා ඒ ආයිත්තම් ලබාගත නොහැකි නම්, ඒ ආයිත්තම් වල වටිනාකම ඔහු වෙත ගෙවනු ලැබිය යුතුය.

(ආ) දෙවන වතාවට හෝ වෙන යම් කවර හෝ අවස්ථාවක හෝ පුහුණුව හෝ රාජකාරි සඳහා හෝ සමශීතෝෂ්ණ කලාපීය රටකට පිටත්ව යන නැවියකු, ඊට කලින් වතාවේ පුහුණුව හෝ රාජකාරි සම්බන්ධයෙන් හෝ ගොස් පෙරලා ශ්‍රී ලංකාවට පැමිණි දින සිට වසර පහක කාල පරිච්ඡේදයක් ගෙවා ඇති විටෙක, එම පස් වසරක කාලය ගෙවී ඇත්තේ ඔහු ශ්‍රී ලංකාවෙන් බැහැරව යාමට පෙර නම්, නාවික හමුදපති විසින් නිශ්චය කරනු ලැබිය හැකි නිල ඇඳුම්වලට අයත් යම් ආයිත්තම් නොමිළයේ ඔහු වෙත නැවත නිකුත් කරනු ලැබිය හැකිය.

(4) විදේශ සිවිල් ඇඳුම් දීමනාව.—රාජකාරි හෝ පුහුණුව සඳහා හෝ සමශීතෝෂ්ණ කලාපීය රටකට පිටත්ව යන නැවියකු හට ඒ රටේ දී නිල ඇඳුමින් සැරසීමට අවසර දී නැති කල්හි නාවික හමුදාපති විසින් නියම කරනු ලැබිය හැකි යම් සිවිල් ඇඳුම් නොමිළයේ නිකුත් කරනු ලැබිය යුතුය. නිකුත් කිරීම සඳහා ඒ ඇඳුම් ලබාගත නොහැකි කල්හි, වරින් වර නිශ්චය කරනු ලබන ගාස්තු ප්‍රමාණ අනුව ඒ ඇඳුම්වල වියදම් ඔහුට ගෙවනු ලැබිය යුතුය.

(5) සිවිල් ඇඳුම් වෙනුවට දෙන දීමනාව.—රෝගීව සිටින යම් නැවියකු, සිවිල් ඇඳුම් වෙනුවට රුපියල් අනුවක දීමනාවක් සඳහා හිමිකම් ලැබිය යුතුය.

විදේශ දීමනාව

30. (1) රාජකාරි හෝ පුහුණුව සඳහා හෝ එතෙර ගොස් සිටින නැවියකු පහත සඳහන් විදේශ දීමනා සඳහා හිමිකම් ලැබිය යුතුය.
(අ) නේවාසිකාගාරයකට අනුයුක්තව සිටින කල්හි — පාලක ප්‍රධාන සුළු නිලධාරී — මසකට රු. 100 බැගින්

ප්‍රධාන සුළු නිලධාරි, සුළු නිලධාරි, නායක නැවි හෝ ඊට සමාන තරාතිරම — මසකට රු. 75 බැගින්
බල නැවි, සාමාන්‍ය නැවි සහ ඊට සමාන තරාතිරම — මසකට රු. 50 බැගින්

(ආ) නේවාසිකාගාරයකට අනුයුක්තව නොමැති කල්හි —

ආයතන අධ්‍යක්ෂ විමසා ලේකම් විසින් වරින්වර නිශ්චය කරනු ලබන ගාස්තු ප්‍රමාණ සහ කොන්දේසි අනුව සියලු නැවියන්ට ඔවුන්ගේ තරාතිරම් ගැන නොසළකා ගෙවීම් කරනු ලැබිය යුතුය.

නැවියකු නේවාසිකාගාරයක නැවති නොසිටින්නේ යයි සැළකිය යුත්තේ —

(i) පුහුණු හෝ රාජකාරි කරනු ලබන ස්ථානයෙහි නේවාසිකාගාර පහසුකම් නොමැති විට ; හෝ

(ii) නේවාසිකාගාරයෙහි ඉඩකඩ පහසුකම් නොමැති විට ; හෝ

(iii) නිවාඩු ලබා සිටින විට හෝ නිවාඩුවක් ගත කරමින් සිටින විට

පමණක් ය.

(2) නැවියකු නේවාසිකාගාරයක නතරවී සිටින විට, එම නේවාසිකාගාරය විසින් අය කරනු ලබන සියලුම අනිවාර්ය ගාස්තු ඒ නැවියාට ප්‍රතිපූරණය කරනු ලැබිය යුතුය.

(3) වික්ෂේපන දීමනාව විදේශ දීමනාව සමඟ එකවිට ගෙවනු නොලැබිය යුතුය.

දුෂ්කර ලැඟුම් දීමනාව

31. (1) (අ) මේ නියෝග වල 12 වන නියෝගයෙහි, නිලධරයන්ට අදාළව බහා ඇති කොන්දේසි යටතේම නෞකාවල සහ යාත්‍රාවල සේවය කරන නැවියන්ට දුෂ්කර ලැඟුම් දීමනාව දිනකට රු. 3 බැගින් ගෙවනු ලැබිය යුතුය.

(ආ) යම් නැවියකු රාජකාරියෙහි යෙදී සිටින ප්‍රදේශයක නේවාසිකාගාර සහ වාසස්ථාන පහසුකම් ද ඇතුළුව ජීවන සහ නිදන සැප පහසුකම් සම්බන්ධයෙන් පවත්නා තත්ත්වය ද නින්දට සහ විවේකයට ඇති වන බාධා වැනි දේවල් සහ ඇති පහසුකම් සමස්තයක් වශයෙන් ගෙන සළකන විට රාජකාරියෙහි යෙදී සිටින නැවියාගේ සෞඛ්‍ය සහ සුව පහසුව කෙරෙහි ඒවා බලපාන්නේ යයි ලේකම්ගේ සහ ආයතන අධ්‍යක්ෂගේ එකඟත්වය ඇතිව නාවික හමුදාපති විසින් නිශ්චය කරනු ලබන විට, ශ්‍රී ලංකාවෙහි එබඳු ප්‍රදේශයක රාජකාරියෙහි යෙදී සිටීම සම්බන්ධයෙන් දිනකට රු. 2 බැගින් වූ දුෂ්කර ලැඟුම් දීමනාවක් ඒ නැවියාට ගෙවනු ලැබිය යුතුය.

(2) යම් නැවියකු වැටුප් නොලබන කවර හෝ කාලපරිච්ඡේදයක් වෙනුවෙන් කිසිම දුෂ්කර ලැඟුම් දීමනාවක් ගෙවනු නොලැබිය යුතුය.

(3) නිලධරයන්ට අදාළව මේ නියෝග වල 12 වන නියෝගයේ (4) වන ඡේදය මගින් බහා ඇති කොන්දේසි යටතේම ක්‍රියාත්මක ප්‍රදේශවල සේවය කරන සහ නෞකාවකට/යාත්‍රාවකට අනුයුක්තව සිටින නැවියකුට වැඩිකළ දුෂ්කර ලැඟුම් දීමනාව ගෙවනු ලැබිය යුතුය.

(4) පුහුණුව ලබමින් සිටින ආධුනිකයින්ට වැඩි කළ දුෂ්කර ලැඟුම් දීමනාව ගෙවනු නොලැබිය යුතුය.

උපදේශක වැටුප

32. (1) දින 30 කට නොඅඩු කාල පරිච්ඡේදයක් සඳහා පූර්ණකාලීන උපදේශක රාජකාරියෙහි යෙදීමේ කාර්යය සඳහා ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ යම් ප්‍රධාන අභ්‍යාස මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබ ඇති නැවියකුට පහත දැක්වෙන අනුප්‍රමාණවලට අනුව උපදේශක වැටුප ගෙවනු ලැබිය යුතුය :—

(අ) සුළු නිලධරයා සහ ඊට ඉහළ — මසකට රු. 150 බැගින්

(ආ) නායක තරාතිරමේ සහ ඊට පහළ — මසකට රු. 100 බැගින්

(2) උපදේශක නොවන රාජකාරි වලට අමතර වශයෙන් (1) වන ඡේදය යටතේ ප්‍රධාන උපදේශක කාර්යාලයක උපදේශක රාජකාරි ඉටු කරනු ලබන යම් නැවියකු උපදේශක වැටුප් වශයෙන් ගෙවනු ලබන මුදලින් අඩක් ලැබීමට හිමිකම ලැබිය යුතුය.

සුදුසුකම් වැටුප

33. යම් නැවියකු —

(අ) සේවයට වටිනාකමක් ඇති විශේෂ දනුමක් ලබා දෙන සේවා පාඨමාලාවක් හදරා ඇති බවටත් ;

(ආ) සේවයට විශේෂ වටිනාකමක් ඇති පාඨමාලාවක් හදරා සාමාන්‍ය හෝ කාර්මික හෝ ඩිප්ලෝමාවක් හෝ සහතිකයක් ලබාඇති බවටත් ;

නාවික හමුදාධිපති ඒත්තු ගන්වා ඇති විටෙක, ඉහත (අ) සිට (ආ) දක්වා ඡේදවල දක්වා ඇති වර්ගීකරණය සම්බන්ධයෙන් පහත සඳහන් ගාස්තු ප්‍රමාණයන් අනුව සුදුසුකම් වැටුප ලැබීමට ඒ නැවියා හිමිකම ලැබිය යුතුය :—

(1) මසකට රු. 300 බැගින්

(2) මසකට රු. 200 බැගින්

යහපත් කල්ක්‍රියා වැටුප

34. (1) යහපත් කල්ක්‍රියා ලාංඡන ලැබ ඇති සෑම නැවියකුටම පහත දක්වෙන ගාස්තු ප්‍රමාණයට අනුව, ඔහුට උචිත වන යහපත් කල්ක්‍රියා වැටුප ගෙවනු ලැබිය යුතු ය:—

ලාංඡන එකක් සඳහා— සුදුසුකම් ලැබීමේ සිව් වසරක කාලය සම්පූර්ණ කිරීමේදී දිනකට ශත 50 බැගින්
ලාංඡන දෙකක් සඳහා— සුදුසුකම් ලැබීමේ අට වසරක කාලය සම්පූර්ණ කිරීමේදී දිනකට ශත 75 බැගින්
ලාංඡන තුනක් සඳහා— සුදුසුකම් ලැබීමේ දොළොස් වසරක කාලය සම්පූර්ණ කිරීමේදී දිනකට රු. 1 බැගින්
ලාංඡන හතරක් සඳහා— සුදුසුකම් ලැබීමේ දහසය වසරක කාලය සම්පූර්ණ කිරීමේදී දිනකට රු. 1.25 බැගින්
ලාංඡන පහක් සඳහා— සුදුසුකම් ලැබීමේ විසි වසරක කාලය සම්පූර්ණ කිරීමේදී දිනකට රු. 1.50 බැගින්

(2) යහපත් කල්ක්‍රියා ලාංඡන සඳහා සුදුසුකම් ඇති කරවන සේවාකාලය නාවික හමුදාධිපති විසින් නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය.

වෙනත් දීමනා

35. (1) කිමිදුම් දීමනා:—කිමිදුම්කරුවන් වශයෙන් සුදුසුකම් ලබා ඇති නැවියෙකුට සැබැවින්ම කිමිදුම් කාර්යවල නිරතවන එක් දිනකට රුපියල් එක බැගින් ගෙවනු ලැබිය යුතු ය.

(2) අරුචි ස්වභාවයේ වැඩ සහ සීමිත ඉඩකඩ ඇති ස්ථානවල වැඩ සඳහා ගෙවන අමතර වැටුප්.—(1) නැවක අණදෙන නිලධරයාගේ අධිකාරිය යටතේ පහත සඳහන් සීමිත ඉඩකඩ ඇති යම් ස්ථානයක, අරුචිකර ස්වභාවයේ වැඩවල හෝ මලකඩ සීරීමේ වැඩවල, පින්තාරු වැඩවල සහ වෙනත් මහන්සියෙන් කරන වැඩවල හෝ යොදවනු ලබන නැවියන් හට දිනකට රුපියල් එකයි ශත පණහක් බැගින් ගෙවනු ලැබිය යුතු ය:—

(අ) සියළුම ද්විත්ව පත්ලකින් යුතු (ඩබල් බොටම්) මැදිරි තුළ ;

(ආ) වාතාශ්‍රයක් ලබා ගැනීමේ ක්‍රම සවි නොකරන ලද දෙපස ඇති සියළු මැදිරි තුළ ;

(ඇ) ඇන්ජිම සවිකර ඇති ස්ථාන යට සහ බොයිලේරු යට ;

(ඈ) එකක් හෝ ඊට වැඩි සාමාන්‍ය කාණු කාවාටයක් මගින් හෝ ජලය කාන්දු නොවන පරිදි, සරනේරු නොයොදා එහෙත් ඇණ සහ මුරිච්චි වලින් සවි කරන ලද චතුරශ්‍රාකාර නැව් කවුළු මගින් හෝ ඇතුල්වීමට හා පිටවීමට ඇත්තා වූ එවැනි ඇතුල්වීම් මාලයකින් හෝ බඩ ගිහසන් හෝ ගොස් කළ යුතු වුවද, 'ඩිස්ට්‍රෝයර්' නෞකා සහ යාත්‍රා හැර වෙනත් යාත්‍රාවල මැදිරි ;

(ඉ) ඩිස්ට්‍රෝයර් යුද්ධ නැව්වල හා ඊට සමාන යාත්‍රාවල පහත සඳහන් මැදිරි:—

(i) ඉදිරිපස මුදුනෙහි ඇති මැදිරි හෝ සවඨනය වන මැදිරි ;
(ii) දම්වැල් අගුල් බණ්ඩිය ;
(iii) යට තට්ටු හෝ බණ්ඩි හෝ වෙඩි බෙහෙත් ගබඩා සහ ෂෙල් සහ ගබඩා කාමර ;
(iv) වෙඩි බෙහෙත් ගබඩා සහ බොයිලේරු කාමර අතර ඇති වාතාවකාශ ;
(v) බොයිලේරු සහ ඇන්ජින් යට සහ පිටුපස ;
(vi) අඩකට වඩා පිරීඇති ගල් අඟුරු බංකර ;
(vii) තෙල් ටැංකි සහ ජලය රඳන ස්ථාන ;
(viii) ගබඩා ද්‍රව්‍ය තැබීමේ හෝ ලබා ගැනීමේ හෝ කාර්යය හැර වෙනත් කාර්ය සඳහා ගබඩා ද්‍රව්‍යවලින් සම්පූර්ණයෙන්ම වාගේ පුරවනු ලැබ ඇති, නැවියන්ට වැඩ කිරීමට සිදුවිය හැකි යම් ගබඩා තුළ ඇති ඉඩකඩ ;
(ix) අවර බූසි මැදිරි;
(x) පිටුපස මැදිරි ; සහ

(ඊ) පරීක්ෂා කිරීමේ රිංගුම් විවර දොරවල් පමණක් ඉවත් කරනු ලැබ ඇති වාෂ්ප වරබයින්වල අභ්‍යන්තර කොටස.

(2) ගල් අඟුරු බංකර හිස්ව තිබෙන විට (1) වන ඡේදයේ කාර්යය සඳහා ඒවා සීමිත ඉඩකඩ ඇති ස්ථාන ලෙස නොසැළකිය යුතු ය. එහෙත්, ගල් අඟුරු බංකරයක් තුනෙන් දෙකක ප්‍රමාණයකට වැඩියෙන් පිරී තිබියදී එහි වැඩ කළ යුතුව ඇත්නම්, ගල් අඟුරු ක්‍රමවත්ව ඇතිරීමෙන් පසුව ඊට ඉහළින් ඇති ඉඩකඩ ප්‍රමාණය සීමිත ඉඩකඩ ඇති ස්ථානයක් ලෙස සැළකිය හැකිය.

(3) සීමිත ඉඩකඩ ඇති ස්ථානයේ වැඩෙහි යෙදී සිටින වැඩ කණ්ඩායම් අධීක්ෂණය කිරීම පිණිස පමණක් එම සීමිත ඉඩකඩ ඇති ස්ථානයෙහි රැඳී සිටීමට සිදුවන්නා වූ පාලක ප්‍රධාන සුළු නිලධරයා, ප්‍රධාන සුළු නිලධරයා, සුළු නිලධරයා සහ නායක නැවියා දිනකට ශත හැත්තෑපහ බැගින් වූ අතිරේක වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

(4) මේ නියෝගය යටතේ අතිරේක වැටුපක් ගෙවීම සඳහා වැඩ පිළිබඳ විස්තර සහිත සටහනක් අණදෙන නිලධරයා විසින් තැබිය යුතු අතර, ගෙවීම කිරීමට පෙර සියළුම ඉඩකඩ ඇති ස්ථාන සහ අවසන් කරන ලද වැඩ කොටසෙහි ස්වභාවය සම්බන්ධයෙන් පූර්ණ විස්තරයක් සහිත සහතිකයක් ලැබිය යුතු ය.

(5) වැඩ ඇඳුම් ඇඳ වැඩ කිරීමට අවසර දී ඇති වාෂ්ප නැව්වල විවෘත කොටස්වල මළකඩ සීරීම හෝ නැවත තීන්ත ගෑම වෙනුවෙන් හෝ සේවාසිකා නැව්වල හැර තට්ටුවල, කැබින්වල, වෙඩි බෙහෙත් ගබඩාවල, ෂෙල් වෙඩි ගබඩා කාමරවල සහ එවැනි වෙනත් ඉඩකඩ ඇති ස්ථානවල සාමාන්‍ය වැඩ සම්බන්ධයෙන් හෝ අතිරේක ගෙවීමක් කරනු නොලැබිය යුතු ය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

(6) බොයිලේරු ඇතුළත හෝ පිටත හෝ පිරිසිදු කිරීමේ වැඩ සඳහා හෝ අඟුරු බංකරවල ගල් අඟුරු ක්‍රමවත්ව ඇතිරීම සඳහා හෝ මේ නියෝ යටතේ නැවියෙකුට අතිරේක වැටුප් ගෙවනු නොලැබිය යුතු ය.

(7) කළ යුතු වැඩ සතුටුදායක ලෙස නිමකර ඇත්නම් මිස, මෙ නියෝගය යටතේ අතිරේක ගෙවීමක් කරනු නොලැබිය යුතු ය.

(8) මේ නියෝගය යටතේ අතිරේක වැටුප් ගෙවීමේ කාර්යය සඳහා යම් කාර්යයක් අරුචිකර ස්වභාවයේ කාර්යයක් සේ සැළකිය හැකිද යන් සම්බන්ධයෙන් හෝ යම් ස්ථානයක් සීමිත ස්ථානයක් ද යන්න සම්බන්ධයෙන් හෝ යම් සැකයක් ඇතිවූ විට, ඒ වෙනුවෙන් ගෙවීම කිරීමට පෙර එය නාවි හමුදාධිපති වෙත යොමු කරනු ලැබිය යුතු ය.

## 111 වන කොටස—පොදු

**සංයුක්ත දීමනාව**

36. (1) තම ස්ථිර රාජකාරි ස්ථානයෙන් පිටත රාජකාරි සඳහා යන්නාවූ ද, නාවික හමුදාවේ වියදමින් ආහාර නොසපයනු ලබන්නාවූද, නාවික හමු විධිවිධාන යටතේ නවාතැන් නොලබන්නාවූද, යම් නිලධරයකු, මධ්‍ය නිලධරයකු හෝ ශිෂ්‍යභට නිලධරයකු හෝ නැවියකු හෝ රජයේ නිලධරයන් සම්බන් යෙන් අදාළ වන ගාස්තු ප්‍රමාණ සහ කොන්දේසි අනුව සංයුක්ත දීමනාවට හිමිකම් ලැබිය යුතුය. අදාළ කළ යුතු ගාස්තු ප්‍රමාණය, නාවික හමුදාධිපතිගෙ අභිමතය පරිදි, ඔහු විසින් නිශ්චය කරනු ලැබිය යුතුය.

(2) නිලධරයකු, මධ්‍ය නිලධරයකු, ශිෂ්‍යභට නිලධරයකු හෝ නැවියකු ගමනෙහි යෙදී සිටින කාලය වෙනුවෙන් සහ තාවකාලික රාජකාරි කටයු සඳහා හෝ අනියම් හෝ තත්කාර්ය ස්වභාවයේ රාජකාරි කටයුතු සඳහා හෝ සේවා ආයතන පිහිටුවා නොමැති ප්‍රදේශවලට සේවා පිරිස් යවනු ලබන අවස් වලදී පමණක්, මෙයින් මතු සංයුක්ත දීමනාව ගෙවනු ලැබේ.

**ජීවන වියදම දීමනාව**

37. රජය විසින් ප්‍රදානය කරනු ලබන්නාවූ යම් පොදු අතිරේක දීමනාවක් ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, නිලධරයන්ට සහ නැවියන්ටද ගෙවනු ලැබිය යුතුය. ජීවන වියදම් වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන දීමනාවකට අයත් ආහාර සහභාගය ඉවත් කරනු ලැබිය යුතුය.

**ගෙවල් කුලී උපරිමය**

38. නාවික හමුදාධිපති විසින් වරින්වර නිශ්චය කරනු ලබන්නා වූ ගාස්තු ප්‍රමාණ සහ කොන්දේසි අනුව නිලධරයන්ට සහ නැවියන්ට ගෙවල් කුලී උපරිමය ගෙවනු ලැබේ.

**ගෙවල් කුලී අයකර ගැනීම**

39. (1) තම පත්වීම කරනු ලබන අවස්ථාවේදී වෙන්කර දෙන ලද සේවා හෝ රජයේ විවාහක වාසස්ථාන හෝ විශේෂ වාසස්ථාන සපයනු ලැබ ඇති යම් විවාහක නිලධරයකු හෝ නැවියකු රජයේ නිලධරයන් සම්බන්ධයෙන් බලා ඇති සමාන කොන්දේසි, අයකිරීම, නිදහස් කිරීම සහ වෙනත් නියමවලට යටත් විය යුතුය.

(2) ඇතුළත වාසය සඳහා නියෝග ලැබ සිටින යම් නිලධරයන්ගෙන්, මධ්‍ය නිලධරයන්ගෙන්, ශිෂ්‍යභට නිලධරයන්ගෙන් සහ නැවියන්ගෙන් ගෙවල් කුලී වෙනුවෙන් කවර හෝ අය කිරීමක් කරනු නො ලැබිය යුතුය.

**සැතපුම් කුලිය**

40. රාජකාරි සම්බන්ධයෙන් ගමන් කරන යම් නිලධරයකුට හෝ මධ්‍ය නිලධරයකුට හෝ ශිෂ්‍යභට නිලධරයකුට හෝ නැවියකුට හෝ රජය විසින් රජයේ නිලධරයන් සම්බන්ධයෙන් බලා ඇත්තා වූ ගාස්තු ප්‍රමාණ හා කොන්දේසි අනුව සැතපුම් කුලිය ලැබිය යුතුය.

**සේවා ස්ථාන වෙනස්වීමෙදී**

41. තම ඉල්ලීම පිට හෝ විෂමාචාරය හේතු කොට ගෙන හෝ වන අවස්ථාවලදී හැර යම් සේවා ස්ථානයකින් හෝ නැවකින් හෝ ආයතනයකින් වෙනත් සේවා ස්ථානයකට හෝ නැවකට හෝ ආයතනයකට හෝ මාස තුනකට නොඅඩු කාලයකට පත් කරනු ලබන නිලධරයකු, මධ්‍ය නිලධරයකු, ශිෂ්‍යභට නිලධරයකු හෝ නැවියකු හෝ රජයේ නිලධරයන් සම්බන්ධයෙන් රජය විසින් නියම කරනු ලැබ ඇති ගාස්තු ප්‍රමාණ හා කොන්දේසි අනුව සේවා ස්ථාන වෙනස්වීම් පිළිබඳ වියදම් ලැබිය යුතුය.

**අතිරේක දීමනා**

42. ආයතන අධ්‍යක්ෂ විමසා ලේකම් විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ගාස්තු ප්‍රමාණ අනුව වෙනත් යම් දීමනා යම් නිලධරයකුට හෝ මධ්‍ය නිලධරයකුට හෝ ශිෂ්‍යභට නිලධරයකුට හෝ නැවියකුට හෝ ගෙවනු ලැබිය යුතුය.

**ස්වේච්ඡා නාවික හමුදාවේ රාජකාරි**

43. නිත්‍ය නාවික හමුදාවට අයත් යම් සාමාජිකයකු පුහුණු කඳවුරක පුහුණුවීමෙහි යෙදී සිටින ස්වේච්ඡා නාවික හමුදා ඒකකයට අයත් පුහුණු කඳවුරක රාජකාරි කරන විට ඒ රාජකාරි කාලය සඳහා එවැනි සාමාජිකයකු තම නිලයේ හෝ තරාතිරමේ සිටින ස්වේච්ඡා නාවික හමුදාවේ සාමාජිකයකුට ගෙවිය හැකි වන්නා වූ පුහුණු කිරීමේ දීමනාවට හිමිකම් ලැබිය යුතුය. ඒ කාල පරිච්ඡේදය තුළදී වික්ෂේපන සහ සංයුක්ත දීමනාවලට ඔහු හිමිකම් නොලැබිය යුතුය.

44. යම් නිලධරයකුට, මධ්‍ය නිලධරයකුට, ශිෂ්‍යභට නිලධරයකුට හෝ නැවියකුට හිමිවන්නා වූ ඒකාබද්ධ වැටුප සහ දීමනාව මාසිකව ඔහු වෙත නිකුත් කරනු ලැබිය යුතුය.

45. නිලධරයකුගේ, මධ්‍ය නිලධරයකුගේ, ශිෂ්‍යභට නිලධරයකුගේ හෝ නැවියකුගේ හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපෙන් තුන්සිය හැටෙන් එක් පංගුවක් ඔහුගේ දෛනික වැටුප් ප්‍රමාණය වශයෙන් සියලු කාර්ය සඳහා ගණන් ගනු ලැබිය යුතුය. එක් මාසයක් දින තිහකින් සමන්විත ලෙස සලකනු ලැබිය යුතුය.

46. වරින්වර සංශෝධිත 1977 පෙබරවාරි 7 වන දින අංක 251/4 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නාවික හමුදා වැටුප් සංග්‍රහය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

47. යම් නිලධරයකු හෝ නැවියකු හෝ තමන් දැනට සිටින නිලයට හෝ තරාතිරමට හෝ වඩා ඉහළ නිලයකට හෝ තරාතිරමකට හෝ උසස් කිරීමෙදී හෝ ඉහළ දැමීමෙදී, එසේ උසස් කිරීමට හෝ ඉහළ දැමීමට හෝ පෙර ඔහු ලැබූ ඒකාබද්ධ වැටුපට අඩු ඒකාබද්ධ වැටුපක් නො ලැබිය යුතුය.

48. මේ නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවොත් මිස, "ලේකම්" යන්නෙන්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

07-481

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.